ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"මක්නිසාද, අප වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ, මවනු ලැබ දෙවියන් වහන්සේගේ කර්මාන්තයව සිටිමුව..." (එපීස 2 : 10)

76 වන වෙළුම අංක 12 (912) 2017 දෙසැම්බර්

සෑම මනුෂ්‍යයෙකුටම උන්වහන්සේගේ කාර්යය

එම්.බී. මේයර් විසිනි

ශාකයක ජීවය මලෙන් හා ගෙඩිවලින් ප්‍රකාශ වන්නාසේම ක්‍රිස්තියානි ජීවිතය නිසැකවම ශුද්ධකමේ ක්‍රියාවලින් ප්‍රකාශ වනු ඇත. වැඩ වැනි ක්‍රියාකාරකම් ගැන කථා කිරීම සම්පූර්ණයෙන්ම සත්‍යයකි. **"ඒ වහාම තමාගේ දානයන්ට බලය ද, එකිනෙකාට තම තමාගේ වැඩ ද දී, අවදිව සිටින්නැයි දොරටු පාලයාට අණ්ඩි. තමාගේ ගෙදරින් පිටත්ව ගොස් අන් රටක නැවතී සිටින මනුෂ්‍යයෙකුට සමානය."** (මාර්ක් 13:34) **නමුත් ඒවා ඵල හටගන්නා ලෙස විස්තර කිරීම තවත් අර්ථයක් ලබාදෙන අතර අපගේ** ස්වාමීන් වහන්සේ සමඟ ඇති ජීවමාන සම්බන්ධතාවය මත සම්පූර්ණයෙන්ම යැපීමෙන් සියලු කාර්යයන් සාර්ථක කර ගැනීම පෙන්නුම් කරයි.

ස්වාමී වූ යෙසුස් වහන්සේ බලවත් සේවකයෙක් වූ සේක. පියාණන් වහන්සේ, යේසුස් වහන්සේට පොළවට පැමිණ ඉටු කිරීමට දුන්නා වූ කාර්යය සම්පූර්ණ කළ සේක. මාර්ක් යේසුස් වහන්සේගේ පොළොවේ ජීවිතය තුළ උන්වහන්සේව පැහැදිලි ලෙස විස්තර කරන්නේ නිරන්තර සහ වේගවත් සේවකයෙකු ලෙසිනි. උන්වහන්සේගේ දවස් සෙනඟගෙන් සහ සිදුවීම්වලින් උදේ පාන්දර සිට රාත්‍රිය දක්වාම පිරී ගියේය. **"දහවල්ව තිබියදී මා වවූ තැනැත්තාහන්සේගේ වැඩ අප විසින් කටයුතුය. රාත්‍රිය පැමිණෙයි එවිට කිසිවෙකුට වැඩකරන්ට නුපුළුවනි."** (යොහාන් 9:4)

උන්වහන්සේගේ ක්‍රියාකිරීම නතරවී ඇතියි සිතම විශාල වැරැද්දකි. සුභාරංචි පොත්වල අපට පවසන්නේ උන්වහන්සේ කිරීමට සහ ඉගැන්වීමට පටන්ගත් දේ පමණි. නමුත් අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත ජීවමාන සහ උට්ඨාන වූ ස්වාමීන් වහන්සේගේ ක්‍රියා පොත ලෙස හැඳින්විය හැකිය. යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැඟිට ස්වර්ගීය පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ හිඳගැනීමෙන් පසු නොකඩවා උන්වහන්සේ කරන්නේ මොනවාද සහ උන්වහන්සේ උගන්වන්නේ මෙනාවද කියා අරුම පුදුම වූ සිදුවීම් වලින් විස්තර කරනු ලබයි. සෑම කාලයකදීම උන්වහන්සේ විශ්වයේ සහ සභාවේ බලවත් වූ සේවකයාව සිටින සේක.

නමුත් ඔසවාගනු ලැබූ ස්වාමීන් වහන්සේට, උන්වහන්සේගේ බලවත් වූ සිතුවිලි සහ අරමුණු ප්‍රකාශ කිරීමට සහ ක්‍රියා කිරීමට අවයව සහ මෙවලම් අවශ්‍ය බව සත්‍ය නොවේද ... ? උන්වහන්සේ සභාව නැමති ශරීරයේ හිසව සිටින සේක. උන්වහන්සේගේ සමාදානයේ සහ බලයේ අභිප්‍රාය ලෝකය වෙතට ගෙන යාමට සභාවේ සාමාජියන්ව මෙවලම් සහ උන්වහන්සේගේ අවයව ලෙස භාවිතා කිරීමට උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. අතීතයේ සිටම උන්වහන්සේගේ දෑත්, තොල් සහ උන්වහන්සේගේ ශරීරයේ කොටස්ව සිටීම තුළ උන්වහන්සේගේ හදවතේ ස්පන්දනය වූ ආශිර්වාද ලබා දුන් සේක. එබැවින් දැන් උන්වහන්සේ තම දෑත්, තොල්, දෙපා සහ ශරීරයවීමට උන්වහන්සේගේ ප්‍රේමණීය සෙනඟව යොදා ගන්නා සේක. ඒ කරුණුකොටගෙන මනුෂ්‍යයන්ට සුවවීමේ ශක්තිය ලබාගත හැකිය. එබැවින් පාවුල් මෙම සත්‍යතාවයට ගැඹුරින්ම අනුකූලවී අන්‍යජාතීන් අතරේ දෙවියන් වහන්සේ තම සේවය තුළ ප්‍රකාශ වූ ආකාරය පැහැදිලි කළේය. (ක්‍රියා 15:12) අපි ඵලදායී ලෙස (බලපෑමකින් යුක්තව) සේවය කිරීමට ආරම්භ කරන විට හෝ ක්‍රියා කරන විට, ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය උන්වහන්සේගේ ක්‍රියා පටිපාටිය ලෙස සේවය කිරීමට අවබෝධ කර නොගෙන එය ඉටු කිරීමට බලාපොරොත්තු විය නොහැකිය.

මෙම බයිබල් පදය කියවන්නා වූ අය අතරේ කෙටි කාලයක් ජීවත්වන මේ ජීවිතයේ දී හැකිතාක් ප්‍රයෝජනවත් ලෙස ක්‍රියා කිරීමටත් ප්‍රයෝජනවත් වන්නා වූ සියලුම හැකියාවන් සම්පූර්ණ කර ගැනීමටත්, ක්‍රිස්තුස් වහන්සේ අවබෝධකර දී තිබෙන දේ අල්ලා ගැනීමටත්, ආශාවක් නැත්තේ කාටද ... ? නමුත් ක්‍රිස්තුස් වහන්සේ මුදාගත් ස්වභාවික සියලු බලයන් මෙම යාච්ඤාව සමඟ සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ කැමැත්ත මත තබන තුරු මෙය කිසිදාක සිදුවන්නේ නැත. ඔබවහන්සේ කැමති පරිදි මා සමඟ මා තුළ, මා වෙත , මා විසින් , මගෙන්ම කරන්නැයි ඉල්ලා සිටීමෙන් අනර්ඝ දොරටු විවෘත කරගත හැකිය. ඔබවහන්සේගේම උත්කෘෂ්ඨ ක්‍රියාව ඉටුකරන්න. මා තුළ ඔබගේ යහපත් කැමැත්ත සම්පූර්ණ කරන්න. එම කැමැත්ත තුළ මාව සම්පූර්ණ කරන්න. කියා යාච්ඤා කළ යුතුය.

විදුලි ඕර්ගන් එක නිර්මාණය කරන්නාට මිහිරි සහ බලවත් ශබ්ද ඇතිව එය ක්‍රියා කරවීමට පහසුකම් සැලැස්විය හැකිවී තබේ. දක්ෂ නිපැයුම් කරුවෙකුට යන්ත්‍රයක විවිධ උපකරණ ඉතා හොඳින් දිග හැරීමට හැකිවේ. ඒ ආකාරයෙන්ම දෙවියන් වහන්සේ අපව කැඳවා ලබාදී තිබෙන්නා වූ හැකියාවන් හොඳින්ම දන්නා අතර ඒවා උන්වහන්සේගේ මහිමය සහ අපගේ ප්‍රීතිය උදෙසා හැසිරවිය යුතු ආකාරයන් හොඳින්ම දන්නා සේක. අපි ස්වාමී වූ යේසුස් වහන්සේට සම්පූර්ණයෙන්ම යටත්වීමේ ප්‍රතිඵලය ලෙස උන්වහන්සේට අප තුලින් කළ නොහැකි මොනවාද .. ?

කිතුණු සේවකයන්ට උපකාර විය හැකි උපදේශයන් කිහිපයක් මෙහි සටහන්කර තබන්නෙමු.

පිරිසිදු චේතනාවෙන් වැඩකරන්න.

කණගාටුදායක ලෙස අපගේ සේවයේ කොපමණ ප්‍රමාණයක් ස්වර්ගය තුළ සඳහන් නොවී ක්‍රමක්‍රමයෙන් මැකී යන්නේද ... ? මක්නිසාද එය හටගන්නේ රැස් කළ නොහැකි චේතනාවන් ඇතුව වේ. අපගෙන් බොහෝ දෙනෙක් අප ක්‍රියා කිරීමට පෙළඹුණාවූ නින්දිත සහ වැදගම්මකට නැති දේවල් නැවත සෝදිසි කරද්දී ඒවා කොපමණ ලැජ්ජා සහගතද ... ? ජීවනෝපායා වැඩිදියුණුවීමට, හොඳ නමක් ලබා ගැනීමට, ඔල්වර හඬදීමේ හැඟීම් ඇවිස්සීමට, සමහර අසල්වැසියන් සමඟ තරඟ කිරීමට, ජයග්‍රහණය ලබා ගැනීමට, දුෂ්කර සහ සම්පූර්ණ කළ නොහැකි කාර්යයන් ඉටුකිරීමට හදවතින් නොව පෙනුමෙන් විනිශ්චය කරන අයගේ ප්‍රශංසාවට ලක් වූ ක්‍රිස්තියානි සේවයේ බොහෝ ක්‍රියාවන් සඳහා මේවා අපට ආශ්වාදයක් ලබා දී ඇත. දෙවියන් වහන්සේ අප සමඟ සතුටු වන්නේ හෝ අපගේ සේවයේ ක්‍රියාවන් පිළිගන්නේ කෙසේද ... ? අපගේ අතිවිශිෂ්ඨ (අනර්ඝ) ක්‍රියාවන් ආපසු හැරවිය නොහැකි ලෙස නතරවී ඇත්තේ ඒවා පොළඹවන ලද චේතනාව නපුරු නිසාය.

අපගේ චේතනාව පවිත්‍ර විය යුතුය. ගසක මුල ගසේ ගෙඩිවලට බලපාන්නේය. ගංගාවක් එහි උල්පතට වඩා ඉහළට ගලා යන්නේ නැත. අපි අපගේම වෙනස් නොවන සිතුවිලි වලින් නිදහස්වීම අවශ්‍යව තිබේ. අපි මනුෂ්‍යන්ගේ ප්‍රශංසා කිරීම හෝ චෝදනා කිරීම අමතක කළ යුතුය. පුද්ගලික අරමුණු සහ ආත්මාර්ථකාමී ආශාවන් (අභිලාෂයන්) පිළිබඳ ගින්න නිවාදැමීමට දිව්‍යමය ප්‍රේමය නැමති සූර්ය්‍යාට අපි ඉඩ ලබාදිය යුතුය. අපි අපගේ දුර්වල සහ විඩාවටපත් හදවත් හෘද වෛද්‍යවරයා වෙතට ගෙන එමින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවය කරුණුකොටගෙන අපගේ හදවත් පවිත්‍ර කරන පිණිස උන්වහන්සේගෙන් අයැද සිටිය යුතුය. තමන්ම ඇළුම්වන්නා වූ නපුර විසුරුවා හැර උන්වහන්සේගේ මිහිරි අවංක සහ පරිපූර්ණ ප්‍රේමයෙන් හදවත පුරවාගත යුතුය. "සෙරාප්වරුන් තුළ ඇති ප්‍රබෝධමත් භක්තියේ පවිත්‍ර දීප්තියෙන් අපගේ හදවත් දැල්වේවා.උසස් තැන්හි වාසය කරන දෙවියන් වහන්සේට මහිමය වේවා.! මෙය අපගේ ජීවිතයේ මොර ගැසීම විය යුතුය.

දෙවියන් වහන්සේගේ සැලැස්මට අනුව සේවය කරන්න.

බයිබලයේ වැඩියෙන් හගවා දෙන කාරණා වලින් දෙවියන් වහන්සේ මෝසෙස්ට පවසන දේ බොහෝ දුරට විහිදී ගොස් ඇති එක් දෙයකි. **"මෝසෙස් මණ්ඩපය සාදන්ට යන කළ, කන්දේදී නුඹට පෙන්වන ලද ආදර්ශය ලෙස සියල්ල සාදන්ට බලාගනින්නැයි දෙවියන් වහන්සේ ආඥා කළ හැටියට ඒ පූජකයෝ ස්වර්ගීය වූ දේවල ඝටහනක්ව, ඡායාවක්ව තිබෙන දෙයට සේවය කරති."** (හෙබ්‍රෙව් 8:5) කණුවක් හෝ තිරයක් හෝ සුවඳ ද්‍රව්‍යවල කුඩා අංශුවක් හෝ කලාකරුවෙකුගේ බුද්ධියෙන් හෝ නීති සම්පාදකයන්ගේ මනාපය (ආශාව) අනුව ඉටු කිරීමට ඉඩ හැර තිබුණේ නැත. සෑම කුඩා කාරණයක්ම දෙවියන් වහන්සේ මෝසෙස්ට එළිදරව් කළ සේක. එම නිසා ඔහු ඒ සියලුම දේ ඉතා ප්‍රවේශමෙන් සැලසුමේ ආකාරයට පිළියල කළ යුතුය තිබුණේය. එය අවසන් වන තෙක්ම ඊශ්‍රායෙල් සෙනඟගේ කී කරුකම අවශ්‍ය විය. සැලස්මෙන් පිට ගොඩනැගීම

2 පිටුවට

1 පිටුවෙන් සෑම මනුෂ්‍යයෙකුටම...

නොකරන පිණිස අවශ්‍ය සියළුම දේ දෙවියන් වහන්සේ බහුලව (අධික ලෙස) ලබාදුන් සේක. අපි උන්වහන්සේගේ සැලැස්ම ක්‍රියාවට නගනවා නම් වැදගම්මකට නැති දේ පිළිබඳව කාංසාවට පත්විය යුතු නැත.

මෙය අපගේ සාර්ථකත්වයේ රහස සමඟ සම්බන්ධ නොවන්නේද ... ? අපි මෙසේ තර්ක කළ හැකිය. මෙය ප්‍රායෝගිකව කළ හැකිව පෙනෙන කාරණාවේ. ඒවා අනර්ඝ පොරොන්දු වන්නේය. අනිත් මනුෂ්‍යයනුත් එය ඉටුකරනු ලබන්නේය. සාර්ථකත්වය ඉක්මනින් ග්‍රහණය කරගෙන ඉතා අනර්ඝත්වයට පත්වේ. මම නිසැකවම එය ඉටු කරන්නනෙමි. එය අපට ඉටු කිරීමට දෙවියන් වහන්සේ පිළියෙල කර තිබෙන යහපත් ක්‍රියාවලින් එකක් දැයි විමසීමට අපි රැඳී නොසිටින්නෙමු. (එපීස 2:10) යාච්ඤා කිරීම කරුණුකොටගෙන සහ බලාසිටීම තුළ එය අප වෙනුවෙන් ඇති දෙවියන් වහන්සේගේ සැලැස්ම ද කියා අවබෝධ කර ගැනීමට අප සොයන්නේ නැත. මෙම විශේෂ වූ මඟපෙන්වීම සඳහා දෙවියන් වහන්සේගේ උපකාරය අවශ්‍ය වන විට එය පහදා දෙන තෙක් යටහත්ව බලා සිටින්නේ නැත.

අපගේම කාර්යයට ගැඹුරින් යොමුවී සිටින විට සහ සියලු ආකාරයෙන් අධෛර්යයට පත්වීමට පැමිණ සිටින විට පමණක් එය අප අනුගමනය කළ යුතු ද කියා ප්‍රශ්න නැගීමට පටන් ගන්නෝය. ඊළඟට දුවගෙන ඇවිත් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ අපි උන්වහන්සේගේ කැමැත්තට අනුව ක්‍රියා කරනවාදැයි නොවිමසා අපගේ කාර්යයන් පිළියෙල කරගෙන එය ක්‍රියාත්මක කිරීම නිසා සිදුවී ඇති පටලැවිල්ලෙන් නිදහස්වීම සඳහා උපකාර කරමින් සමාව ලබාදෙන ලෙසයි. කාරණය නම් පළමුව උන්වහන්සේ කරන්නේ කුමක්ද සහ උන්වහන්සේට අපට උපකාර කළ හැකි කොයි ආකාරයෙන් දැයි අසනවා වෙනුවට අපි යම් දේවල් කරන්නට ආරම්භ කර උන්වහන්සේගේ උපකාරය ඉල්ලා සිටින්නන් බවට පත්ව සිටීමයි.

මෙම ජීවන රටාව උදාසීන සිහිනවලට හේතු වන්නේය. තමන් දෙවියන් වහන්සේගේ මාර්ගයෙහි සිටින බව අවබෝධ කරගෙන ශුද්ධ වූ ක්‍රියාකාරකම් බලවත් ලෙස, අප්‍රමාදව, උද්යෝගිමත්ව ඉටු නොකරන උන්වහන්සේගේ තෝරාගැනීමේ සැලැස්මේ කාරණා සුළු වශයෙන් ඉටුකර උන්වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ කළා යැයි සාධාරණීය කරමින්, උන්වහන්සේගේ සම්පූර්ණ වූ ප්‍රඥාව මත තිබෙන සියලු වගකීම් ඉවත්කර දමා ඇත.

කාර්යයන් ඉටු කිරීම සඳහා අතනට, මෙතැනට දුවන්න එපා. ස්වාමීන් වහ්නසේට උපමනා දේ කිරීමට වෙන කෙනෙක් පවසන්නේ කොහොමද ... ? අපට පුළුවන් වන්නේ අනුමාන කිරීමට පමණි. ඔබගේ ජීවිතය වෙනුවෙන් කෙලින්ම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට යන්න. උන්වහන්සේගේ මහිමාන්විත ඇසුර වසා දැමීම ඔබට දරාගත නොහැකි බව උන්වහන්සේට පවසන්න. ඔබගේ තත්ත්වය පෙන්වා දෙනු පිණිස උන්වහන්සේට ආයාචනා කරන්න. ප්‍රේතෘස් මෙන් දර්ශනයේ කාර්යයට යොමුවන තුරු සහ බොහෝ දුර ගමන් කරන පණිවිඩකරුගේ තට්ටු කිරීමෙන් ඔබට අවශ්‍යය කාරණයට ඔබව කැඳවන තුරු කිසිවිටෙකත් තෘප්තිමත් නොවන්න.

පවිත්‍ර කරනු ලැබූ අය මෙන් නැවුම් ලෙස වැඩකරන්න.

පූජකයන් ශුද්ධස්ථානයේ සේවය කිරීමට පෙර බදුන සෝදාගත යුතුය. ඔවුන්ද ස්වාමීන් වහන්සේගේ භාජන දරන්නන් බැවින් පවිත්‍රව සිටිය යුතුය. මනුෂ්‍යයෙක් ලෙස ඔහු පව් කළොත් තමාවම පවිත්‍ර කරගත යුතුය. "එබැවින් යමෙක් මේවා අත්හැර තමාම පවිත්‍ර කර ගනී නම්, ඔහු පිරිසිදු කරනු ලැබුවාවූ, ස්වාමියාගේ පාවිච්චියට සුදුසු වූ, සියලු යහපත් වැඩවලට සූදානම් වූ ගෞරවය පිණිස වූ , භාජනයක් වන්නේය. (2 තිමෝති 2 :21)

ආගන්තුකයෙකුට බීමට නැවුම් වතුර වීදුරුවක් දීමට සිදුවන විට අපි ඉක්මනින් රාක්කයේ තිබෙන භාජනය පිරිසිදු කරගන්නෙමු. අපි අනර්ඝ සහ ශෝභන කෝප්ප පසුකර පවිත්‍රකමින් අඩු මැටි භාජන පවිත්‍ර කරනු ලබයි. එලෙස අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොදුවේ උන්වහන්සේගේ පාවිච්චියට සුදුසු ලෙස පවිත්‍රව සූදානම්ව තිබේ නම් පමණක් උන්වහ්නසේගේ සේවය සඳහා අපව පාවිච්චි කරනු ලබන සේක.

දෙවියන් වහන්සේගේ ශක්තිය තුළ සේවය කරන්න.

කිසිම මනුෂ්‍යයෙක් තමාගේම නියෝග මත යුද්ධයට යන්නේ නැත. නමුත් බොහෝ කිතුණුවන් තර්ක කරන්නේ එය ස්වර්ගීය ස්ථාවරව තිබෙන්නා වූ නියෝග වලින් එකක් බවයි. කෙසේ වෙතත් කිසි කෙනෙක්ව, කිසිවිටෙක දෙවියන් වහන්සේ ලබා දී ඇති ශක්තියේ සීමාවන් තුළ සිටින බව නොදන්න කාර්යයකට කැඳවන්නේ නැත. එසේ නැති නම් වෙනතකට හැරුණාවූ හදවතක් ඇතිව සිටින කෙනෙකුට එය ලබාදීමට උන්වහන්සේ සූදානම්ව නොසිටින සේක. දෙවියන් වහන්සේට ක්‍රියා කිරීමට අපගේ ශක්තිය අවශ්‍ය නොවන සේක. අපගේම ශක්තිය බොහෝ විට බාධාවක් වන්නේ අපි උන්වහන්සේගෙන් බැහැරවී අපගේම ශක්තිය මත විශ්වාසය තබන බැවිනි. අපගේ දුර්වලකමේ දී , අපගේ දුබලතාවයේ දී, අපගේ හිස්කමේදී උන්වහන්සේ ක්‍රියා කරන සේක. **"නමුත් ඒ බලයේ ඉතා උතුරකම අපට නොව දෙවියන් වහන්සේට අයිති වන පිණිස වේ වස්තුව අපි මැටි භාජනවල දරාවුව."** (2 කොරින්ති 4:7)

බල රහිත බව පිළිබඳව ඔබගේ කල්පනාවෙන් ඔබ කළ යුතු කාර්යයට බාධාවක් කර නොගෙන උන්වහන්සේගේ ශක්තිය මත රැඳිසිටීමින් සාමය ඇතිව සිටීමට ඔබ පෙළඹෙන්නේ නම් එය ඔබගේ සාර්ථකත්වයේ ප්‍රබලතම අංගයක් වනු ඇත. **"උන්වහන්සේ ද, මාගේ කාරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේ දී මාගේ බලය සම්පූර්ණ වන්නේ යැයි මට කී සේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාර්ට්ටු කරන්නෙමි."** (2 කොරින්ති 12:9)

කිතුණු සේවයේ සමහර කාර්යයන් භාර ගැනීමට කිතුණුවන්ගෙන් ඉල්ලා සිටින විට නිදහසට කාරණා කියන්නා වූ අයව මට නිතර මුණගැසී ඇත. මට එය කරන්නට නොහැකියි. මම ඒ සඳහා සුදුසු නැහැ, මට කථා කිරීමට හැකියාවක් නැහැ. ආදී කාරණාවන් කියන අයට නැවත කාන්තාරයට යාමට සහ මෝසෙස්ගේ අතේ තිබුණාවූ සැරයැටියේ පාඩම ඉගෙන ගැනීම අවශ්‍යව තිබේ. තමන්ට පැවරෙන කාර්යය භාර ගැනීමට ඔහු ප්‍රමාණවත්ද යන බව ප්‍රශ්න කළේය. එම නිසා ඔහු තමාගේ අතේ තිබුණා වූ සැරයැටිය දෙවියන් වහන්සේ ඉදිරියේ බිම දැමීමෙන් උන්වහන්සේ ඔහුට අළුත් බලයක් ලබා දුන් සේක. දෙවියන් වහන්සේගේ බලය තුළින් ස්වභාවිකව කළ නොහැකි දේ කළ හැකි විය. රතු මුහුද හරහා මාර්ගයක් සෑදීමට, අමලෙක්වරුන්ගේ සේනාව පරාජය කිරීමට, ගිණිගල් පර්වතයෙන් වතුර ගෙන ඒමට හැකි විය.

ක්‍රිස්තුස් වහන්සේගේ අතේ තිබෙන්නා වූ සැරයැටිය ලෙස අපට එය කළ නොහැකි වන්නේ ඇයි .. ? උන්වහන්සේ නැතිව අපට බට ගසක්වත් කැඩිය නොහැකිය. නමුත් උන්වහන්සේ තුළ විශාල මාළිගාවක කුළුණු වුවත් පෙරළා දැමිය හැකිය. **"මා බලවත් කරන්නා වූ තැනැත්තාණන්සේ තුළ වට සියලු දේ කරන්ට පුළුවන."** (පිලිප්පි 4:13)

එමෙන්ම දෙවියන් වහන්සේගේ අනර්ඝ වූ වචනය කඩිසරව අධ්‍යයනය කිරීම තරම් උන්වහ්නසේගේ ශක්තිය ලබා ගැනීමට වෙනත් හොඳ ක්‍රමයක් නැත. මෙය අපගේ ආත්මයේ අභ්‍යන්තරයට ශක්තිය ප්‍රකාශ කිරීමේ මාධ්‍යය වන්නේය. එය ධාන්‍ය වලින් අපගේ පොළොවේ ජීවිතයට පෝෂණ ශක්තිය ලබා දෙන්නාක් මෙන්ය. කිතුණු සේවකයෙනි, ඔබ ශක්තිමත්වීමට නම් ඔබගේ බයිබලය කියවන්න. එමෙන්ම එය සිත තුළ කාවැදී ඇති පුද්ගලයාට ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පාවිච්චි කිරීමට බොහෝ පුදුම ලෙස පුළුවන්කම ලැබේ. ඒ අතරම මුනෂ්‍යයාගේ හදවත් වෙත සදාකාලික සත්‍යතාවයේ මාධ්‍යය ලෙස උන්වහන්සේ විසින් පෙන්වා දී තිබෙන ශුද්ධ ලියවිල්ලේ සිතුවිලි සහ වාක්‍ය අනුසාරයෙන් ප්‍රකාශයට පත්ව තිබේ.

විශ්වාසයේ බලාපොරොත්තුව තුළ වැඩ කරන්න.

අධෛර්යයට පත්වුණා වූ මනුෂ්‍යයන්ව දෙවියන් වහන්සේ පාවිච්චි කරන්නේ නැහැ කියා නිතරම සහ සැබෑ ලෙස කියන්නට හැකි වන්නේ ද කෙසේද ... ? එය විශ්වාස නොකරන සහ බලාපෙරෝතු නොවන තැනැත්තාට කිසිදාක සාර්ථකත්වය විශාල වශයෙන් හිමිකර ගැනීමට නොහැකිවේ. ඒ අනුව අනිත් සියලුම ආත්මික කාර්යයන් වෙනස් නොවන්නා වූ එක නීතියක් කරුණුකොටගෙන පාලනය වන්නේය. ඔබගේ ඇදහිල්ල අනුව එය ඔබට සිදුවේ. **"මාගේ වෙහෙකරුවූ මෝසෙස් නුඹට අණකල මුළු ව්‍යවස්ථාවේ ප්‍රකාර කරන්ට බලාගන්න පිණිස ශක්තිවත්ව ඉතා ධෛර්යවත්ව සිටපන්න. නුඹ යන සැම තැනදීම නුඹට ශුභසිද්ධ වන පිණිස එයින් දකුණටවත්, වමටවත් නොහැරෙන්න."** (යොෂුවා 1:7)

ඔවුන් තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් නැවත පැමිණෙන බව දන්නා බැවින් නිසැකකම ඇතිව පිටතට නොයා සිටින්නේ ඇයි .. ? අපි දෙවියන් වහන්සේගේ කාර්යය සඳහා පිටත්ව යමු. අපට උන්වහන්සේගේ බීජ සපයා දී තිබේ. උන්වහන්සේගේ නොවරදින ප්‍රඥාවෙන් නියමිත කාර්යය සඳහා අපව කුඹුර වෙතට මඟ පෙන්වන සේක. උන්වහන්සේ සහතික ලෙසම හිරුඑළිය, වැසිපොද, පින්න, වැස්ස අපට ලබාදෙන සේක. ගොවියා මෙන් අපි බලා සිටිය යුතුය. නමුත් එහිදී අන්තිමය දක්වා සැකයක් නැතිව සිටිය යුතුවේ.

දිව්‍යමය ප්‍රේමය තුළ ඇති ආශාවෙන් අපට දී තිබෙන සේවයේ ප්‍රතිඵලය (බලපෑම) කොපමණ මහිමාන්විතද ... ? දෙවියන් වහන්සේගේ මුදා ගැනීමේ අභිප්‍රාය තුළ අපව මෙවලම් සහ මාධ්‍යයක් කරගන්නා සේක. නැතිවී සිටින්නන්ව ගැලවීමට ගෙනෙන පිණිස ක්‍රිස්තුස් වහන්සේ සමඟ හවුල් වන්නෙමු. දැල් වෙන්නා වූ ගිණිපෙනෙල්ලක් ලෙස මනුෂ්‍යයන්ව ගළවා ගනිමු. රජ්ජුරුවන්ගේ පෙරමඟට යාම සඳහා දැල්වෙන්නා වූ පහනක් දරා සිටින්නන් මෙන් වෙමු. උන්වහන්සේගේ දෙවෙනි පැමිණීමේ ප්‍රීතිමත් දවස ඉතා ඉක්මනින් පැමිණේ ඒ සඳහා පෙරමඟ දූතයන් සහ තානාපතියන් වෙමු.

එය ඉටු කිරීම සඳහා අපව කැඳවා තිබේ. එය සදාකාලික කාර්යයක් බව දැන ගැනීම දහස් ගුණයකින් වඩා හොඳය. එය මෙලෙස ලියා ඇත. **"කිසි ශාපයක් තවත් නොවන්නේය. එහි දෙවියන් වහන්සේගේ ද, බැටළු පැටවාණන්ගේද සිංහාසනය වන්නේය. උන්වහන්සේ වෙහෙකරුවෝ උන්වහන්සේට වෙහෙකරන්නෝය."** (එළිදරව් 22:3)

ස්වාමීන් වහන්සේගේ කාර්යය තුළ අධිකව යෙදී සිටින්න.

රිච් කැම්වෙල් විසිනි

"යේසුස් වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද, රාජ්‍යයේ සුභාරංචිය දේශනා කරමින්ද සියලු අකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුව කරමින්ද සියලු නුවරවලද, ගම්වලට ඇවිද්ද සේක. උන්වහන්සේ සමූහයන් දැක ඔවුන් එඩේරෙකු නැති බැටළුවන් ලෙස හිරිහැර විඳිමින් විසිර ගොස් සිටිය බැවින් ඔවුන් කෙරෙහි අනුකම්පා කළ සේක. එවිට උන්වහන්සේ තමන් ගෝලයන්ට කථාකොට ගොයම නම් බොහෝය. නුවුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරපල්ලා යයි කී සේක." (මතෙව් 9:35-38)

මනුෂ්‍යයන්ගේ ආත්මික සහ භෞතික අවශ්‍යතාවයන් පිළිබඳව ස්වාමීන් වහන්සේ ගැඹුරින් සලකන සේක. එමෙන්ම ඔවුන් උදෙසා උන්වහන්සේට ඇති ප්‍රේමයට ප්‍රතිචාර දක්වන බොහෝ දෙනා සිටින බවද උන්වහන්සේ දැන සිටින සේක. ඒ මනුෂ්‍යයන් උන්වහන්සේගේ ප්‍රේමය සමඟ අනිත් අය වෙත සමීප වන්නෝය. ස්වාමීන් වහන්සේගේ අස්වැන්න නෙළීමේ කාර්යය සඳහා අපවත් සම්බන්ධ කර ගැනීමට උන්වහන්සේ ආශාවෙන් සිටින සේක.

යේසුස් වහන්සේ එම කාර්යය සඳහා උන්වහන්සේගේ ජීවිතය කැප කළ සේක. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් සමඟ මෙලෙස පැවසූ සේක. **"යේසුස් වහන්සේද, මාගේ කැමැත්ත නම් මා එවූ තැනැත්තාගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය."** (යොහාන් 4:34) යේසුස් වහන්සේ මෙම ප්‍රකාශය උන්වහන්සේ සමාරියේදී කළ සේවය අතර තුර පැවසූ සේක. සමාරියේ ස්ත්‍රියට සහ ඇගේ නගරයේ සෙනඟට ඇදහිල්ල තුළ දෙවියන් වහන්සේ වෙතට පැමිණීමට උන්වහන්සේ ඉඩ හැරිය සේක. ඇත්ත වශයෙන්ම යෙසුස් වහන්සේගේ සේවයේ ප්‍රධාන කාර්යය නැතිවී සිටින අයව සොයා යාම සහ ඔවුන්ව ගළවා ගැනීම වූ සේක. (ලූක් 19:10) එය අවසානයේ දී උන්වහන්සේ දේශනා කරමින්, උගන්වමින්, සුවකරමින්, ධෛර්‍යමත් කරමින් සහ ආත්මික, ශාරීරික හිඟකම් සම්පූර්ණ කළ සේක. උන්වහන්සේ පැමිණියේ ...., **"එසේම, මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව, සේවය කරන්ටද බොහෝ දෙනෙක් උදෙසා විඳීමේ විලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආවේයයි කීසේක."** (මතෙව් 20:28) උන්වහන්සේ ජීවත්වූයේ සහ මරණයට පත්වූයේ අනිත් අයට දෙවියන් වහන්සේව දැන ගැනීමට උපකාර කරන පිණිසය.

එය විශ්මයට කාරණයක් නොවේ. එබැවින් අස්වැන්න නෙළීමේ කාර්යයට අපව යොමු කරනු ලබන සේක. **"තව සාර්වාසයක් ගිය කළ ගොයම් කපන කාලය පැමිණෙන්නේ යයි නුඹලා කියනවා නොවේද ... ? මම නුඹලාට කියමි නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා "** (යොහාන් 4:35) අපි උන්වහන්සේගේ දෑත්, උන්වහන්සේගේ දෙපා, උන්වහන්සේගේ හඬ වශයෙන් උන්වහන්සේ ක්‍රියාවේ යොදවන අයවී නැතිවී සිටින අය වෙතට ළඟාවී ඔවුන්ව ගැලවීම තුළ ගොඩනැගිය යුතුය. කාලය ඉතා කෙටිය. දෙවියන් වහන්සේගේ සෙනඟ වශයෙන් සෑම අවස්ථාවක්ම පාවිච්චි කළ යුතුය. **"එහෙයින් මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, ස්වාමීන් වහන්සේ කෙරෙහි නුඹලාගේ වෙහෙය නිශ්ඵල නොවන බව නුඹලා දන්නා බැවින් ස්ථිරවව්, නිශ්චලවව්, නිතරම ස්වාමීන් වහන්සේගේ වෙහෙයෙහි වඩ වඩා පවතිව්."** (1 කොරින්ති 15:58) ඔබට ධෛර්යමත් කිරීමේ අදහසින් මෙම බයිබල් ඡේදය තුළ අඩංගුව තිබෙන සත්‍යතාවයේ කාරණා තුනක් සලකා බැලීමට මම ඔබට ආරාධනා කරමි.

(1) ස්වාමීන් වහන්සේ උදෙසා කරන සේවය දුෂ්කර විය හැකිය.

අපගේ මෙහෙය නිශ්ඵල නොවන බව අපෝස්තුළු පාවුල් ලියා ඇත. ඔහු එහි පාවිච්චි කර තිබෙන ග්‍රීක් වචනයේ අදහස "මහන්සි වෙනවා" යන්නයි. එයින් විඩාවට පත්වන දුෂ්කර කාර්යයක් ප්‍රකාශ වන බව අවබෝධ කර දෙයි. එසේ වුවත්, දෙවියන් වහන්සේගේ කාර්යය කරන විට බොහෝ ප්‍රීතිය ගෙන දෙන්නේය. මෙම සේවය ඉතාම දුෂ්කර බව පාවුල් දැන සිටියේය. එමෙන්ම මෙම අසීරු වූ සේවය පිළිබඳව ඔහුගේම ජීවිතයෙන් ආදර්ශයක් දෙනු ලැබීය. (1 කොරින්ති 15:10) සම්බන්ධ වී සිටින්නා වූ කාර්යය දේශනා කිරීම, ඉගැන්වීම, දීම, යාච්ඤා කිරීම, සුභාරංචිය පතල කිරීම, මඟ පෙන්වීම, ආගන්තුක සත්කාරය, ධෛර්‍යමත් කිරීම හෝ වෙන කුමන සේවයක් වුවත් එය ඉතා ඕනෑකමින් ඉටුකරන ලෙස අපේක්ෂා කරන සේක.

(2) ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ මෙහෙය ඉටු කිරීම සඳහා අවශ්‍ය දේ සපයා දෙන සේක.

"තවද නුඹලා සියලු දේවලදී නිතරම පූර්ණකම ලැබ සියලු යහපත් ක්‍රියා සඳහා පූර්ණව සිටින පිණිස නුඹලාට සියලු අනුග්‍රහය වැඩිකර දෙන්ට දෙවියන් වහන්සේට පුළුවන." (2 කොරින්ති 9:8) අපට දෙවියන් වහන්සේගේ කාර්යයෙහි අධිකව පැවතිය හැකිය. මක්නිසාද උන්වහන්සේගේ කරුණාව අප තුළ බහුලව පවතින අතර උන්වහන්සේගේ කාර්යය ඉටු කිරීමට අපට අවශ්‍යය සියලුම දේ උන්වහන්සේ සපයා දෙන සේක. අප තුළ උන්වහන්සේගේ කරුණාව අධිකව පවතිනවා පමණක් නොව උන්වහන්සේම අප තුළ වාසය කරන සේක. යේසුස් වහන්සේ මෙලෙස පැවසූ සේක. **"මා පියාණන් වහන්සේ තුළෙහිත් පියාණන් වහන්සේ මා තුළෙහිත් සිටින බව විශ්වාස කරන්නේ නැද්ද ... ? මා නුඹලාට කියන වචන වලව උපදවා කථා නොකරමි. නුවුත් පියාණන් වහන්සේ මා තුළඟේ වසමින් ස්වකීය ක්‍රියා කරන සේක."** (යොහාන් 14:10) පාවුල් තුමාට ද මේ ආකාරයෙන් පැවසීමට හැකි විය. **"ඒ අර්ථ මා තුළ බලවත් ලෙස කෙරෙන උන්වහන්සේගේ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ඒ සඳහා වම පොර අල්ලමින් වීර්යය කරමි."** (කොලොස්සි 1:29) එබැවින් අප තුළ සහ අප තුලිනුත් ක්‍රියා කිරීමට ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වය මත අපට විශ්වාසය තැබීමට පුළුවන. උන්වහන්සේගේ මහා නියෝගයේ කොටසක් ලෙස සකල ජාතීන් වෙත ගොස් ඔවුන් ගෝලයන් කිරීමේ දී යේසුස් වහ්නසේ අප සමඟ සෑම විටම සිටින බවට අපට පොරොන්දු වී තිබෙන සේක. (මතෙව් 28:20) අපගේ සිත්වලට ධෛර්යය ලබාදීමට උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. එමෙන්ම සෑම යහපත ක්‍රියාවල ද, වචනවල ද අපට ස්ථිර කරන සේක. (2 තෙසලෝනික 2:17)

ස්වාමීන් වහන්සේගේ සේවය උදෙසා කොයි අංශයකින් හෝ ඔබ හිඟව සිටිනවාද ..... ? සමහර විට ඔබ ධෛර්යමත් කිරීමෙන් හිඟව තිබෙනවාද ... ? සෙන්හෙඩ්‍රියන් මන්ත්‍රණ සභාව විසින් ප්‍රේත්‍රස්ට සහ යොහාන්ට තර්ජනය කළ විට නොකඩවා සේවය කිරීමට ස්වාමීන් වහන්සේ ඔවුන්ව ධෛර්යමත් කළ ආකාරය දෙස සැලකිල්ලෙන් යුතුව බලන්න. (ක්‍රියා 4:13 සිට බලන්න.) ඔබට නිර්භීතකම නැතිව සිටිනවාද ... ? ගෝලයන් යාච්ඤා කළේ කොහොමද කියා සැලකිල්ලෙන් යුතුව බලන්න. **"ඔවුන් යාච්ඤා කළ පසු ඔවුන් රැස්ව සිටි ස්ථානය කම්පා විය. ඔවුන් සියල්ලෝද ශුද්ධාත්මයෙන් පූර්ණව දෙවියන් වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය."** (ක්‍රියා 4:31) ඔබට ශක්තිය නැතුව සිටිනවාද ..? දිරිගැන්වීම, ප්‍රඥාව, බලය නැතිව සිටිනවාද ... ? උන්වහන්සේගේ සැපයීම තුළ අපට සියලු දේ කළ හැකිය. මේ හේතුවෙන් යේසුස් වහන්සේ මෙසේ ඉගැන්වූ සේක. **"සැබැවක්, සැබැවක් නුඹලාට කියමි. මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය. මා පියාණන් වහන්සේ ළඟට යන නිසා විට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය. නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත්, පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමය ලබන පිණිස මම එක ඉෂ්ට කරන්නෙමි."** (යොහාන් 14:12-13) අපට ස්වාමීන් වහන්සේගේ කාර්යය අධික ලෙස කළ හැකිය. මන්ද උන්වහන්සේගේ අභිමුඛත්වය, උන්වහන්සේගේ බලවත් වූ නාමය, උන්වහන්සේගේ පණිවිඩයේ බලය දී තිබන සේක. (රෝම 1:16) අපට සම්පූර්ණයෙන්ම උන්වහන්සේ තුළ රැඳී සිටීම අපේක්ෂා කළ හැකිය. උන්වහන්සේ අප තුළ වාසය කරන විට අප බොහෝ ඵල දරන්නෝය. (යොහාන් 15:5)

(3) ස්වාමීන් වහන්සේගේ කාර්යය වැදගත්ය

එකිනෙක මනුෂ්‍යයාගේ සේවය සෝදිසි කරන දවසක් පැමිණෙන්නේය. "එක් එක් කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය. (1 කොරින්ති 3:13) ජීවිතයේ බොහෝ දේවල් තාවකාලික වුවත් ස්වාමීන් වහන්සේගේ කාර්යයන් වලට සදාකාලික වැදගත්කමක් ඇති බව අපි දනිමු. එය නිශ්ඵල නොවේ. ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත්වී තැන්පත් කරනු ලැබ, මළවුන් නැගිටුණු අතර නැවත උන්වහන්සේ පැමිණේ. උන්වහන්සේගේ ජීවිතය සහ ප්‍රේමය අනිත් අය සමඟ බෙදා ගැනීමට අපි කරන කාර්යය වැදගත් වන අතර එය සදාකාලයටම වැදගත්වේ.

එවැනි කාර්යයන් ස්වාමීන් වහන්සේට ඉතා වැදගත්ව තිබෙන සේක. **"මක්නිසාද නුඹලාගේ වැඩයද, නුඹලා ශුද්ධවන්තයන්ට කළා වූ, කරන්නා වූ උපස්ථානයෙන් දෙවියන් වහන්සේගේ නාමයට පෙන්වූ ප්‍රේමයද වතක නැති කරන්ට උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත."** (හෙබ්‍රෙව් 6:1) දෙවියන් වහන්සේට මෙය කොයිතරම් පුද්ගලිකද කියා ඔබට පෙනෙනවාද ... ? අපි උන්වහන්සේගේ වැඩ කරන විට සහ උන්වහන්සේගේ සෙනඟට උපකාර කරන විට එය උන්වහන්සේට ප්‍රේම කරනවා වැනිය. යේසුස් වහන්සේ උගන්වන විට මෙය සිහිකරනු ලැබූ සේක. උන්වහන්සේගේ මේ සහෝදරයන්ගෙන් කුඩා කෙනෙකුට වුවත් අපි යම් දෙයක් කරන විට එය ඉටු කරනු ලබන්නේ උන්වහන්සේට යැයි කී සේක. (මතෙව් 25:40) අපගේ මෙහෙය උදෙසා යම් දවසකදී උන්වහන්සේ ප්‍රතිවිපාක ලබාදෙන සේක. (1 කොරින්ති 3:8)

ස්වාමීන් වහන්සේ උදෙසා අප කරන කාර්යය පැහැදිලිවම අප සේවය කරන අයට වැදගත්ව තිබේ. ස්වාමීන් වහන්සේ පැමිණෙන විට අපගේ වචන වලින් සහ අපගේ සේවය තුළින් ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරී ක්‍රිස්තුස් වහන්සේ තුළ ශක්තිමත් වූ අය ගැන අපි ඉමහත් ලෙස ප්‍රීති නොවන්නෙමුද **... ? "අපගේ බලාපොරොත්තුවත් ප්‍රීතියත්, පාර්ථිවුවේ ඔටුන්නත් කිවෙක්ද ... ? අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේගේ ඊවේදී උන්වහන්සේ ඉදිරියෙහි නුඹලාව නොවේද... ? එසේය නුඹලා අපේ ගෞරවයත් , අපේ ප්‍රීතියත්ය."** (1 තෙසලෝනික 2 : 19-20) එම නිසා ස්වාමීන් වහන්සේට මහිමය පැමිණෙන පිණිස අපගේ මුළු සේවය මහත් ආශිර්වාදයක් වන්නේය. යේසුස් වහන්සේ පොළොවේ සිටිද්දී පියාණන් වහන්සේ උන්වහන්සේට ඉටු කිරීමට දුන් කාර්යය සම්පූර්ණ කිරීම කරුණුකොටගෙන පියාණන් වහන්සේට මහිමය ගෙන දුන් සේක. (යොහාන් 17:4) එම නිසා පියාණන් වහන්සේ අපට පවරා දී තිබෙන කාර්යය සම්පූර්ණ කරමින් උන්වහන්සේට මහිමය ලබාදෙමු. (මතවේ 5:16, 1 ප්‍රේත්‍රුස් 2:12) සියල්ලට පසුව අපි ....., **"මක්නිසාද අපි වනාහී යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ වවනු ලැබ දෙවියන් වහන්සේගේ කාර්මාන්තයව සිටිමුව. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන් වහන්සේ ඒවා කලින් සූදානම් කළ සේක."** (එපීස 2:10) සැබවින්ම අපව මුදා ගැනීම උදෙසා යේසුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිතය පූජා කළ සේක. **"උන්වහන්සේ සියලු අධර්මිෂ්ටකම් වලින් අප මුදා යහපත් ක්‍රියා ගැන ජවලිත වූ සෙනඟක් ස්වකීය සම්පතක් කොට පවිත්‍ර කරගන්න පිණිස අප උදෙසා තමන්ම දුන් සේක."** (තීතස් 2:14) එය කොයිතරම් වරප්‍රසාදයක්ද ... ? **"එබැවින් යමෙක් මේවා අත්හැර තමාම පවිත්‍ර කරගනී නම්, ඔහු පිරිසිදු කරනු ලැබුවාවූ, ස්වාමියාගේ පාවිච්චියට සුදුසු වූ සියලු යහපත් වැඩවලට සූදානම් වූ ගෞරවය පිණිස වූ භාජනයක් වන්නේය."** (2 තිමෝති 2:21) අපි උන්වහන්සේගේ කාර්යය ක්‍රියාවට නගන විට උන්වහන්සේට ගෞරවය හා මහිමය ලැබේ.

උන්වහන්සේගේ කාර්යය තුළ ඉදිරියට යාමට ඉල්ලා සිටින සේක.

මෙම ධෛර්යමත් කිරීමේ පණිවිඩය තුළ ඔබ ස්වාමීන් වහන්සේගේ කාර්යය තුළ ඉදිරියට යයි කියා අපි බලාපෙරොත්තු වන්නෙමු. ඔබ වෙහෙස මහන්සිවී වැඩ කිරීමෙන්, වෙහෙසට පත්ව සිටිනවා නම් වෙහෙසට පත්වූවනට ශක්තිය සහ දුර්වලයන්ට බලය ලබාදීමට විශ්වාසවන්තව සිටින තැනැත්තා දෙස බලන්න. (යෙසායා 40:29) උන්වහන්සේ නැවත ඔබව නැවුම් බවට පත්කර ඔබව ගොඩනගා උන්වහන්සේ සමඟ ඔබේ ගමන් කිරීමේ දී සහ උන්වහන්සේ වෙනුවෙන් ඔබ කරන කාර්යයේදී ඔබව අලුත් කරන සේක. ධෛර්යමත්ව හොඳින් අවසන් කිරීමට සහ යේසුස් වහන්සේ ඔබට ලබා දී තිබෙන සේවය සම්පූර්ණ කිරීමට උපකාර කරන සේක. (කොලොස්සි 4:17) අපෝස්තුළු පාවුල් සමඟ එක්ව යම් දවසක බලාපොරොත්තු වන දේ ප්‍රකාශ කළ හැකිය. "මම යහපත් යුද්ධයෙහි යුද්ධ කළෙමි. දිවීම කෙළවර කළෙමි. මම ඇදහිල්ල රක්ෂා කළෙමි." (2 තිමෝති 4:7-8)

"අපේ දෙවි වූ ස්වාමීන්ගේ අලංකාරය අප කෙරෙහි වේවා. අපේ අත්වල වැඩ අප කෙරෙහි ස්ථිර කළ මැනව " (ගීතාවලිය 90:17)

දේශ සීමාවේ සේවය කළ දේවදාසයකුගේ භාර්යාවගේ අත්දැකීම

මෙම ලිපිය ක්‍රි.ව. 1800 දී ඇමරිකානු දේශසීමාවේ සේවය කළ මිෂනාරී භාර්යාවකගේ නිවසේ සිට යවන ලද ලිපියකි.

එක් ශීත කාලයක මාගේ ජීවිතයේ ගලක කොටූ දවසක් මෙන් කැපී පෙනෙන දවසක් මාගේ මතකයේ තිබේ. කාලගුණය අසාමාන්‍ය ලෙස ශීතලව තිබුණි. අපගේ වැටුප ප්‍රමාණවත් ලෙස ලැබී තිබුණේ නැත. එමෙන්ම අපගේ අවශ්‍යතාවයන් ද ඒ වන විට සම්පූර්ණවී තිබුනේ ද නැත. මාගේ ස්වාමිපුරුෂයා බොහෝ අවස්ථාවලදී එක් දිස්ත්‍රික්කයකින් තවත් දිස්ත්‍රික්කයකට පිටත්ව ගියේය. මාගේ පුත්‍රයන් හොඳින් සිටි නමුත් මගේ කුඩා දුව වන රුත් අසනීපව සිටියේය. අප කිසිවෙකුට ප්‍රමාණවත් ලෙස ශීතලට ඇඳීමට ඇඳුම් තිබුනේ නැත. මම ඔවුන්ගේ ඇඳුම් පැච් දමා නැවත නැවත මැසුවත් මාගේ ආත්මයේ ඔවුන් ගැන තිබූ ශක්තිය ක්‍රමක්‍රමයෙන් අඩුවෙමින් පැවතුණි. ළිඳෙන් ජලය සිඳී ගියේය. බිම ඉරිතැලීම හරහා සුළඟ හමා ගියේය.

දේවස්ථානයට අයත් සෙනඟ දයාවන්තව ත්‍යාගශීලී විය. නමුත් ජනාවාස අළුත් නිසා සෑම පවුලක්ම ඔවුන්ගේ ජීවිත පිළිබඳව පොරබදමින් සිටියෝය. ටිකෙන් ටික මගේ ඇඳහිල්ල උස්පහත් වෙන්නට (සෙළවෙන්නට) පටන් ගත්තේය. මගේ ජීවිතයේ කලින් මම දෙවියන් වහන්සේගේ වචනය ඉගැන්වූයෙමි. මම එම සත්‍යතාවය හොඳින් ක්‍රියාවට නංවනවා යැයි සිතුවෙමි. දාවිත් කළාක් මෙන් මගේ බලකොටුව සහ ගැලවුම්කරුවාණන් කවුදැයි දැනගෙන මම දන්නා වූ මුළු අඳුරු කාලවලදීත් පොරොන්දු මත ජීවත් වූයෙමි. දැන් මට දිනපතා යාච්ඤාවෙදී කළ හැකිව තිබුණේ සමාව ඉල්ලීම සඳහා යාච්ඤා කිරීම පමණකි.

මාගේ සැමියාගේ කබාය ඔක්තෝබර් මාසයේ ශීතලට අදින්නට තරම් ප්‍රමාණවත් ලෙස ඝනකම්ව නොතිබූ අතර රැස්වමකට හෝ අවමංගල්‍යයකට සහභාගිවීමට සැතපුම් ගණන් එය ඇදගෙන යාමට ඔහුට සිදු විය. බොහෝ අවස්ථාවලදී අපේ උදෑසන ආහාරය වූයේ ඉන්දියන් කේක් සහ සීනි නැතිව තේ කෝප්පයකි. නත්තල පැමිණෙමින් තිබුණි. දරුවන් ඔවුන්ගේ තෑගි අපේක්ෂාවෙන් සිටියෝය. අයිස් ඝනව සහ සිනිදුව පැවතුණා මට මතක තිබේ. පිරිමි දරුවන් අයිස් මත ලිස්සා යන පාවහන්වලට ආශාවෙන් සිටියෝය. මම හදපු බෝණික්කන් දැන් සුදුසු නැහැ කියා රුත් සිතුවාය. ඇයට හොඳ විශාල බෝණික්කෙක් අවශ්‍යව තිබුණි. ඇය ඒ වෙනුවෙන් තදිනම යාච්ඤා කළාය. එය සිදුවිය නොහැකි බව මම දැන සිටියෙමි. දරුවන් තිදෙනාටම අවශ්‍ය දේවල් මම ලබාදෙන්නේ කෙසේද ? දෙවියන් වහන්සේ අපව අතහැර දමා ගොස් තිබෙනවා වාගේ පෙණුනත් මම මගේ මහත්තයාට මේ හැමදේම නොකීවෙමි. ඔහු ඉතා උනන්දුවෙන් සහ හදවතින් වැඩ කළේය. මම හිතුවා එයා වෙනදා වගේම බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා. මම ශීතලට විවෘතව තිබෙන ගින්දර දල්වන කාමරය සතුටු සිතින් පිළියෙල කිරීමට හැකි තරම් ප්‍රමාණයෙන් ආහාර පිරිනැමීමට උත්සාහ කළෙමි.

බලාපොරොත්තු රහිත අඳුරු දවසක්

නත්තලට කලින් දින උදෑසන ජේම්ස්ට අසනීපව සිටි කෙනෙක්ව බැලීමට යන්නට සිදුවී තිබුණි. මම ඔහුට දිවා ආහාරය සඳහා පාන් කෑල්ලක් පිළියෙල කර දුනිමි. එය මට කරන්නට පුළුවන් හොඳම දෙය වූවාය. මගේ ගෙතු සළුව ඔහුගේ ගෙළ වටා ඔතා පසුව මම නිතර දුන් පරිදි පොරොන්දුවක් මුමුණන්නට උත්සාහ කළෙමි. නමුත් ඒ වචන මගේ තොල් වලින් අහිමිවී ගොස් තිබුණි. වෙනදා මෙන් පොරොන්දුවක් මුමුණන්ගේ නැතිව මම ඔහුට යන්නට ඉඩ හැරියෙමි. එය බලාපොරොත්තු රහිත අඳුරු දවසක් විය. මට දරුවන්ගේ කථාව දරාගන්න බැරි නිසා මම එයාලාව වේලාසනින් නිදා ගන්නට පෙළඹුවෙමි. රුත් ගොස් ඇගේ යාච්ඤාව කරනවා මට ඇසුණි. අවසාන වතාවට ඉතා විශේෂ ආකාරයෙන් ඇගේ බෝණික්කා සහ සහෝදරයන්ගේ හිම මත ලිස්සා යන සපත්තු යාච්ඤා කරමින් ඉල්ලා සිටියාය. "අම්මා ඔයා දන්නවා ඒවා හෙට උදේ පාන්දරම මෙහෙට එවයි කියලා" ඇය මුමුණනවිට ඇගේ මුහුණ කොයිතරම් දීප්තිමත්ව පෙණුනාද ... ? ඇගේ බලාපොරොත්තු සුන්වීමෙන් ගලවා ගන්නට මට අහසයි, පොළවයි සොළවන්නට පුළුවන් වුනානම් කියලා සිතුණා. මම තිනයම වාඩිවී වඩා වේදනාවෙන් කඳුළු සැලුවෙමි.

වැඩි වේලාවක් යන්න කලින් ජේම්ස් නැවත පැමිණි අතර ඔහු හොඳටම ශීතලවෙලා සහ හෙම්බත් වෙලා සිටියේය. ඔහු ඔහුගේ සපත්තු ගලවලා දැමීය. ඔහුගේ දෙපාවල දමා තිබූ සිහින් දිග මේස්ද ගැලවුවේය. ඔහුගේ දෙපා රතුවී සීතලවී තිබුණේය. ඔහු විශ්වාසවන්ත සේවකයෙකි. මම හිස ඔසවා ඔහු දෙසා බැලූ විට ඔහුගේ මුහුණේ ඉරියව් දැඩි සහ බලාපොරොත්තු සුන්වූ ස්වභාවයෙන් දුටුවෙමි. ජේම්ස් ද නිවාස ඇතුලට ගියේය. මම ඔහුට තේ කෝප්පයක් රැගෙන ආවෙමි. ඔහු අසනීප තත්ත්වයක සහ සිත අවුල් වූ තත්ත්වයක සිටින බව පෙනුනේය. ඔහු මගේ දෑත්වලින් අල්ලාගත් අතර අපි වචනයක්වත් කථා නොකර පැයක් පමණ වාඩිවී සිටියෙමු. මට අවශ්‍ය වුනේ මැරිලා දෙවියන් වන්සේව මුණ ගැසෙන්න. උන්වහන්සේගේ පොරොන්දු සැබෑ නොවූ බව උන්වහන්සේට කියන්න. මාගේ ආත්මය කැරළිකාර සහ බලාපොරොත්තු සුන්වූ තත්ත්වයෙන් පිරී තිබුණේය.

සමාදානය සෙවීම

නිවසේ සීතුව නාද වෙනවා ඇසුණු අතර එය ක්ෂණිකව නතරවී හයියෙන් දොරට ගහන සද්දයක් ආවේය. ජේම්ස් පැනගෙන ගොස් දොර ඇරියේය. දොරළඟ සුදු ජාතික උපස්ථාදායකයෙක් සිටිගෙන සිටියේය. අඳුර වැටෙන්නට ප්‍රථම ඔබට සීඝ්‍රගාමී තැපෑලෙන් පාර්සලයක් ආවේය. මට එතිනන් පිටත්වෙන්න පුළුවන් වුන ගමන්ම මම එය රැගෙන ආවේය. මම විශ්වාස කරනවා එය නත්තල වෙනුවෙන් වෙන්න ඇති කියලා. "මේ කළුකුම් මස්ද, ඔයා ඇනවුම් කර ගෙන්වා ගත්තාද, මම හිතන්නේ අනිත් දේවල් ඔයාට අවශ්‍යය දේවල් වෙන්න ඇති කියා මම ජේම්ස්ගෙන් ඇසුවෙමි." එහි අර්තාපල් අල කුඩයක් සහ පිටි බෑග් එකක් තිබුණි. කඩිමුඩියේ කතාකරන ගමන්ම පෙට්ටිය රැගෙන ආ සහෝදරයා හෘදයාංගමව සුභ රාත්‍රියක් කියමින් පිටත්ව ගියාය.

ජේම්ස් කිසිවක් කථා නොකරන නියනක් සොයාගෙන පෙට්ටිය විවෘත කළාය. මුලින්ම ඔහු පෙට්ටියෙන් ඝන රතු බැලැන්කේට්ටුවක් පිටතට ඇදලා ගත්තේය. ඊට යටින් ඇඳුම් වලින් පිරී තිබෙන බව අපි දුටුවෙමු. ඒ මොහොතේ ක්‍රිස්තුස් වහන්සේ මට අප්‍රසාදය ඵලකරමින් බලා සිටින්නාක් මෙන් මට හැඟුණි. ජේම්ස් බිම වැටී ඔහුගේ දෑත් වලින් මුහුණ වසාගෙන මට ඒවාට අතගසන්න බැහැ කියා වේදනාවෙන් හඬ නගා කීවේය. මගේ කාරණා සැබෑ නොවූ විට මට දරාගෙන සිටිය හැකිදැයි බැලීමට දෙවියන් වහන්සේ ඉඩ හරින සේක. ඔබ සිතනාවද ඔබ දුක්විඳින ආකාරය බලන්න මට බැරිවුනා කියා දෙවියන් වහන්සේ අසන්නාක් මෙන් මට දැණුනි. මට උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කරන්න වචන නැති විය. දෙවියන් වහන්සේ වෙතින් අහක්ව යාම කොයිතරම් අප්‍රසන්නව තිබෙනවාදැයි දේශනා කිරීමට දැන් මම දනිමි.

"මෙහෙම හිතට ගන්නා එපා මගෙයි වරද, මට ඔයාට උදව් කරන්න ලැබුණා..." කියා මම ජේම්ස්ට ළංව කීවෙමි. අපි එක්ව දෙවියන් වහන්සේගෙන් සමාව අයැද සිටියෙමු. "තව ටිකක් ඉන්න දෙන්න මට තවම කථාකරගන්න බැහැ කියා ඔහු වෙනත් කාමරයකට ගියේය." මම දණින් වැටුණෙමි. මගේ හදවත බිඳී තිබුණේය. හදිස්සියෙන් සියළුදේම අඳුරු විය. සියළුම හිතුවක්කාර කාරණාවන් පහව ගියේය. යේසුස් වහන්සේ නැවත පැමිණ මා ඉදිරියේ සිටගත්සේක. මෘදු මොළොක් බව සහ ප්‍රීතිය පිළිබඳව මිහිරි පොරොන්දු මගේ ආගමයට ගලා ආවේය. කෘතඥතාවය සහිත ප්‍රශංසාවේ මා ගිලී ගිය අතර අනිත් සියල්ල අමතක විය. ජේම්ස් එතනට පැමිණ කොපමණ වෙලාවක්දැයි මම නොදනිමි. නමුත් ඔහුත් සමාදානය ඇතිව සිටින බව මම දැන ගතිමි. දැන් ඔහු මගේ ප්‍රේමණීය භාර්යාව කියා කීවේය. අපි එක්ව දෙවියන් වහන්සේට ස්තුති කළෙමු. ඊළඟට ඔහු ප්‍රශංසාවේ බයිබල් වාක්‍යයන් ප්‍රකාශ කළේය. අපගේ ප්‍රශංසාව නතර කිරීමට කිසි දෙයකට නොහැකි විය.

දෙවියන් වහන්සේ අපගේ නිශ්චිත උපකාරකයාණෝය.

ඒ වන විට රාත්‍රී 11.00 වී තිබුණි. අපි අළුත් ලී කොට කිහිපයක් ගොඩගසා ඒ මත ඉටිපන්දම් දෙකක් දල්වා අපට ලැබී තිබුණු පෙට්ටියේ තිබෙන ඒවා සෝද්සි කළෙමු. අපි ජේම්ස්ට ගැළපෙන ප්‍රමාණයේ කබායක් එළියට ගත්තෙමු. මම විනෝදයෙන් සහ සැහැල්ලුවෙන් ඔහු වටේ කැරකෙමින් නැටුවෙමි. එහි සළුවක් ද, උණුසුම් ඇඳුම් කට්ටලයක්ද ලොම් වලින් සෑදූ ඇඟට තදවන සේ අඳින කලිසම් කුට්ටම් තුනක්ද, මට සරිලන ඇඳුමක්ද, අපි සැම දෙනාටම ආක්ටික් උඩු සපත්තු යුගලයක්ද, අත් ආවරණද එහි තිබුණේය. එමෙන්ම ජේම්ස්ට පැහැදිලිව ලියා තිබූ කඩදාසි කැබැල්ලක් ද එහි විය. එම කඩදාසි කැබැල්ලේ මෙලෙ ලියා තිබුණි. **"එක්නිසාද නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේ වන මම භය නොවන්න. මම නුඹට පිහිට වන්නෙමියි කියමින් නුඹේ දකුණත අල්ලන්නෙමි."** (යෙසායා 41:13)

එහ ඉතා සැලසුම් සහගතව අසුරන ලද පුදුමාකාර පේට්ටියක් විය. එහි අපේදරුවන් වන පුතාලා දෙදෙනාට අඳුම්ද, දුවට කුඩා රතු ගවුමක්ද විය. අපට අවශ්‍ය අත්වැසුම්ද, හිස් ආවරණද වූයේය. පෙට්ටිය මැදට පැමිණි විට එහි බෝණික්කෙක් තිබුණේය. මගේ දෑස් වලින් නැවත කඳුළු කඩා හැලෙන්නට පටන් ගත්තේය. ජේම්ස් ද මා සමඟ ප්‍රීතියෙන් කඳුළු සැලුවාය. ඊළඟට අපි දෙදෙනාම නැවත පුදුමයට පත්වූයෙමු. හිම මත ලිස්සා යන සපත්තු ජෝඩු දෙකක් ද එහි තිබුණේය. රන් මෙන් වටිනා ඩොලර් දහයක් සහිත ලියුම් කවරයක්ද තිබුණි. අපට කියවන්නට පොත් ද තිබුණි. අවසානයේ දී අපට ලැබී තිබුණු සියල්ල ගැන අපි අඬමින් දෙවියන් වහන්සේට ස්තුති කළෙමු. ඒ වන විට මධ්‍යම රාත්‍රියත් පසුවී තිබුණි. අපි සතුටින් ක්ලාන්තව වෙහෙසට පත්ව සිටියෙමු. මම උණුසුම් තේ කෝප්පයක් පිළියෙල කළ අතර ජේම්ස් අලුත් පාන් පෙති කිහිපයක් කපා බිත්තර බැඳ පිළියෙල කළේය. අපේ කෑම මේසය උණුසුම්ව තිබුණි. අපේ වේදනාව ප්‍රීතියට හැරුණේ කොහොමදැයි බලන්න. ඊළඟට අපි අපගේ ජීවිත ගැන සහ සැමවිටම දෙවියන් වහන්සේගේ නිශ්චිත උපකාරය සහිත සැපයීම ගැන කථා කළෙමු.

ඊළඟ උදෑසන දරුවන්ට සිදුවූයේ කුමක්දැයි ඔබට සිතා ගැනීමට හැකිද .. ? හිම සපත්තු දුටු පුතාලා දෙදෙනා ශබ්ද නගා කෑ ගැසීය., දුව බෝණික්කාව තුරුල් කරගෙන කථා කරන්නට වචන නැතිව සිටියේය. ඊළඟට ඇය ඇඳට ගොස් දෙවියන් වහන්සේට ස්තුති කරමින් මුමුණනවා මට ඇසුණේය.

දුෂ්කරවූ අවස්ථාවන් නැවත නැවත පැමිණියේය. නමුත් අපි දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් භය, සැක නැතිව උන්වහන්සේගේ සැලකිල්ල සහ රැකවරණය දෙස බලා සිටියෙමු. නැවත, නැවත දෙවියන් වහන්සේ අපගේ අවශ්‍යතාවයන් සපයා දුන් සේක. **"තරුණ සිංහයෝ හිඟ ඇතිව සාගින්න විඳිති. නමුත් ස්වාමීන් සොයන්නන්ට කිසි යහපත් දෙයකින් හිඟයක් නොවන්නේය."** (ගීතාවලිය 34:10)

"යේසුස් වහන්සේ ද මාගේ කෑම නම් මා එවූ තැනැත් වහන්සේගේ කැමැත්තකොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. ..... ." (යොහාන් 4:34)

සියළු මනුෂ්‍යයන්ගේ කර්මාන්තය ගින්නෙන් එළිදරව් වන්නේය.

ජෝර්ජ් ඩී. වොට්සන් විසිනි.

"මට දෙන ලද දෙවියන් වහන්සේගේ අනුග්‍රහය පරිද්දෙන් ප්‍රඥාවන්ත ප්‍රධාන ගෘහකාර්යයෙකු වෙන් එම අත්තිවාරමක් දැම්මි. වෙන කෙනෙක් ඒ පිට ගොඩනගයි. නුමුත් එකිනෙකා ඒ පිට ගොඩනගන්නේ කෙසේදැයි බලාගනීවා. එක්නිසාද දවා තිබෙන අත්තිවාරම ඇර වෙන අත්තිවාරමක් දවන්නට කවරෙකුටවත් නුපුළුවන. ඒ අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. නුමුත් අත්තිවාරම පිට යමෙක් රන්, රිදී, අනර්ඝ ගල්, ලී, තෘණ, පිඳුරු ගොඩනගන්නේ නම්, එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. එක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය. ඒ පිට ගොඩනැගුවාවූ යම් කෙනෙකුගේ කර්මාන්තය පවතී නම් ඔහු විපාකයක් ලබන්නේය. යම් කෙනෙකුගේ කර්මාන්තය දැවී යන්නේ නම් ඔහුට අලාභ වන්නේය. නුමුත් ඔහුව ගැලවෙන්නේය. එහෙත් ගිනිමැදින් ගැලවුනාක් මෙන්ය." (1 කොරින්ති 3:10-15)

ධර්මිෂ්ඨයන්ට අදාළ විනිශ්චයේ ස්වභාවය සහ විවිධ මට්ටම් දැක්වීමේදී සමහරවිට මෙය මුළු බයිබලයේ වඩාත්ම කැපී පෙනෙන ඡේදය විය හැකිය. සෑම කිතුණුවෙකුගේම ඇදහිල්ලේ හා ක්‍රියාවන් හි පදනම යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. **"එක්නිසාද දවා තිබෙන අත්තිවාරම ඇර වෙන අත්තිවාරමක් දවන්ට කවරෙකුටවත් නුපුළුවන. ඒ අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේය."** මෙම පදනම ගැලවීමේ ඇදිහිල්ලේ පදනම වන අතර ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිදු කරනු ලබන සියලු යහපත් ක්‍රියාවල පදනම වේ. මේ වචනයේ අදහස නම් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණුකොකට ගෙන මිස ගැලවීම ලබාදීමට හැකි හෝ දෙවියන් වහන්සේට පිළිගත හැකි යහපත් ක්‍රියාවක් කරන්නට හැකියාව ලබාදීමට හැකි වෙනත් පුද්ගලයෙක් හෝ ආගමක් ලෝකයේ කිසිම කාලයුගයක පවතින්නේ නැත.

"එසේ නම් නුඹ නුඹේ සහෝදරයා විනිශ්චය කරන්නේ එක්නිසාද .. ? නොහොත් නුඹ නුඹේ සහෝදරයා කුමක් පිණිස සුළුකොට සිතන්නෙහිද .. ? එක්නිසාද අපි සියල්ලෝම දෙවියන් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි පෙනී සිටින්නෙමුව. එක්නිසාද මා ජීවත්ව සිටිනු සැබැවාසේම සැම දණහිස් මට නමන්නේය. සැම දිවිද දෙවියන් වහන්සේට ප්‍රකාශ කරන්නේය කියා ස්වාමීන් වහන්සේ කියන සේකැයි ලියා තිබේ. එහෙයින් අපි එක් එක්කෙනා තම තමා ගැන දෙවියන් වහන්සේට ගණන් දෙනවා ඇත." (රෝම 14:10-12)

"එක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේ දී කළා වූ දේවල වල ඒ දේ යහපත් වුවත්, අයහපත් වුවත්, කළ දේවල හැටියට ලබන පිණිස, අප සියල්ලෝම ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි ප්‍රකාශවෙන්නට ඕනෑය. එබැවින් ස්වාමීන් වහන්සේ කෙරෙහි භයවීම කිවෙක්දැයි දන්නා වූ අපි මනුෂ්‍යයන්ට පොළඹවමුව...." (2 කොරින්ති 5:10-11)

"මෙන්න ඉක්මනින් එමි. එකිනෙකාට තම තමාගේ ක්‍රියාවේ හැටියට දෙන පිණිස මා සමඟ විපාක තිබේ." (එළිදරව් 22:12)

කිතුණුවන් යැයි කියා ගන්නා බොහෝ දෙනෙක් ගැළවීම සහ ප්‍රතිවිපාක අතර වෙනස සම්බන්ධයෙන් අඳුරේ සිටින නිසා අපි මෙහිදී ඇදහිල්ල සහ ප්‍රතිවිපාක අතර වෙනස හඳුනාගක යුතුය. අපගේ කිසිදු යහපත් ක්‍රියාවකින් නොව ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරුණුකොටගෙන පමණක් අපි ගැලවීම ලබා ඇත්තෙමු. (එපීස 2:8-9) නුමුත් මරණයට පෙර මේ ශරීරයේ දී අප කරන ක්‍රියාවලට අනුව අපට විපාක ලැබේ.

ඇදහිල්ල ආරක්ෂා කිරීම අප්‍රමාදව කළ යුතු නමුත් යහපත් ක්‍රියාවන් ටිකෙන් ටික සහ ක්‍රමානුකූලව රැස් කරනු ලබයි. ඇදහිල්ල ආරක්ෂා කිරීම ක්‍රිස්තුස් වහන්සේ මත පමණක් රදා සිටිමින් අපව පවිත්‍ර කිරීම, අපට සමාවදීම උන්වහන්සේ තුළ සිදුවේ. නුමුත් යහපත් ක්‍රියාවන් හැඩ ගැන්වෙන්නේ අපගේ හැකියාව, දැනුම සහ උද්යෝගය (යමක් වෙනුවෙන් ඇති කැපවීම) තුලින්වේ.

ඇදහිල්ල ආරක්ෂා කිරීමෙන් ස්වර්ග රාජ්‍යයට අපි ඇතුල්වන නමුත් යහපත් ක්‍රියා කරුණුකොටගෙන ලැබෙන ප්‍රතිවිපාකය තුළ ස්වර්ග රාජ්‍යයේ අපගේ ස්ථානය සහ පැමිණෙන්නාවූ කාලයේ දී අපට ලැබෙන තේජස (මහිමය) සඳහා ප්‍රයෝජනවත් වන ආකාරය තීරණය කරනු ලබයි. මේ වර්තමාන ජීවිතයේ දී ඇදහිල්ල ආරක්ෂා කළ යුතු නමුත් අපට විපාකය ලැබෙන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමේදී සහ ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියේදීය. අපි සියලුදෙනාම ගැලවීම ලබන්නේ ඒ ආකාරයෙන් නමුත් අපි සියලුදෙනාම විපාක ලබන්නේ අපගේ යහපත් ක්‍රියාවලට අනුව වෙනස් වූ ප්‍රමාණ වලින්ය.

වෙනස් වූ ද්‍රව්‍ය වලින් ගොඩනැගීම

අත්තිවාරම මත කිතුණු ජනතාව වෙනස් වූ ද්‍රව්‍ය වලින් ගොඩනගනවා අපට අවධානය යොමු කළ හැකිවේ. මනුෂ්‍යත්ව ගැලවීම වෙතට යොමු කරන පිණිස ක්‍රිස්තුස් වහන්සේව පමණක් විශ්වාස කරන සියල්ලෝම එකම අත්තිවාරමක් මත සිටිති. නමුත් කිතුණුවන්ගේ ජීවිත එකිනෙකාට වෙනස්ව පවතින අතර එකිනෙකාට වෙනස් වූ දේවලින් ගොඩනගති. එබැවින් ඔවුන්ගේ ක්‍රියාවල ස්වභාවයේ සහ ඔවුන්ගේ ප්‍රතිවිපාකය වෙනස්වී ඇත.

ගොඩනගන්නාවූ විවිධ ද්‍රව්‍ය නියෝජනය කිරීමට ද්‍රව්‍ය හයක් අපෝස්තුළුවරයා සඳහන් කරයි. රන්, රිදී, අනර්ඝ ගල් යන ද්‍රව්‍යය දහනය කළ නොහැකි ද්‍රව්‍ය වේ. ඊළඟට ලී, පිදුරු, තෘණ යන ද්‍රව්‍ය දහනය කළ හැකි ඒවා වේ. සෑම කිතුණුවෙක්ම තම ආගමික ජීවිතය ගොඩනගා ගන්නේ තමා සතුව ඇති ගැලවීමේ කරුණාවේ ප්‍රමාණයට අනුව සහ ඔහුගේ සිතුවිලි සහ අභිප්‍රායන්වල බලයට අනුව වේ. ඒවා ලෞකික හෝ ආත්මික හෝ ඒවා මිශ්‍ර වූ ඒවා වීමට පුළුවන.

මෙම බයිබල් කොටස මම පැහැදිලි කරනවා වුවත් කිතුණු ඇදහිලිවතුන් ක්‍රිස්තුස් වහන්සේ මත ගොඩනගන්නෝය. සැබෑ අත්තිවාරම උන්වහන්සේය. ඒ අතරම ඔවුන් ගොඩනගන්නාවූ ද්‍රව්‍යය මිශ්‍ර වූ ස්වභාවයෙන් පවතියි. බොහෝ අවස්ථාවලදී භාගයක් ලෞකිකව සහ භාගයක් ආත්මිකව පවතියි. මෙම මිශ්‍රවීම කිතුණු ජීවිතයේ සහ සේවයේ සෑම අංශයකම අන්තර්ගතවී ඇත. එමෙන්ම විනිශ්චය දවස පැමිණෙන තෙක් එය අවබෝධ කරගන්නේද නැත. රන්, රිදී, අනර්ඝ ගල් වලිනුත්, ලී, තෘණ, පිදුරු වැනි ද්‍රව්‍යය වලිනුත් ගොඩනගනු ලබන්නෝය.

උදාහරණයක් වශයෙන් ශුද්ධාත්මයෙන් සම්පූර්ණයෙන්ම පවිත්‍රවී ආලෝකවත් නොවූ කිතුණු දේව සේවකයන් ඔවුන්ගේ දේශනාවල සත්‍යය සහ වැරදි යන දෙකම ඇතුළත් කර ඇත. ක්‍රිස්තුස් වහන්සේ සහ මාංශයත්, ආත්මික කාරණා සහ මාංශික කාරණාත් ඇතුළත් කර ඇත. යම් ප්‍රමාණයකට ක්‍රිස්තුස් වහන්සේව මහිමයට පත්කිරීමට සොයනු ලබන අතර ඒ අවස්ථාවේදීම බොහෝ ක්‍රියාමාර්ගවලින් තමාවම ගෞරවයට පත්කර ගැනීමට සොයන්නෝය. එමෙන්ම ඔවුන්ගේම ගෞරවය, කීර්තිය සහ ආත්ම අභිලාෂය (තමන්ගේම කැමැත්ත) ඉදිරියට ගෙනයාමට සොයන්නෝය. ඔවුන්ගේ දේශනාව සන්නිවේදනය කිරීමට ඔවුන්ගේ මිශ්‍ර වූ ආගමික අත්දැකීම් අවශ්‍යව තිබේ. කිතුනුවන් දෙවියන් වහන්සේට ඉදිරිපත් කරන යාච්ඤාවන් තුළ බොහෝ අවස්ථාවලදී ආත්මාර්ථකාමී ස්වරූපය වර්ධනය වී ඇත. සැබෑ යාච්ඤාව ශුද්ධ ලියවිල්ල සමඟ මිශ්‍රවී ඇති නමුත් බොහෝ යාච්ඤාවන් ස්වර්ගයට නැගිය නොහැකි තරම් ආත්මාර්ථකාමීවයෙන් පිරී ඇත.

ආගමික ඉගැන්වීම් තුලත්, පොත්පත් තුලත්, බයිබලීය දේශනා තුලත් සත්‍යතාමය සහ වැරදි දේ මිශ්‍රවී ඇත. දෙවියන් වහන්සේගේ වචනය විකෘති කර කෙනෙකුගේ ආගමික ඇදහිල්ලට හෝ නිකායට අයත් දේව ධර්මයට දෙවියන් වහන්සේගේ වචනයේ සැබෑ අර්ථය නිරූපණය කිරීම අභිබවා යාමට ඉඩ ඇත. අපගේ ආගමික අභිප්‍රායන් තුළ දෙවියන් වහන්සේව සතුටු කිරීමට අදහස් කරන බොහෝ දේ තිබිය හැකිය. නමුත් බොහෝ කිතුනුවන් ඔවුන්ගේ ආගමික අභිප්‍රායන් තුළ ආත්මාර්ථකාමී බව ප්‍රකාශ කරනු ලබති. දේවස්ථාන ගොඩනැගීමේදී, මිෂනාරී සේවාවන් කරගෙනයාමේදී ළමයින් පුහුණු කිරීමේදී වැනි සියලු කාර්යයන්වලදී ආත්මාර්ථකාමීත්වයේ අදහස් පවතියි.

ක්‍රියාවන් පැහැදිලිව ප්‍රකාශ කරනු ලබයි.

මේ බලවත් වූ ආගමික ජීවිතය හා කිතුණු චරිතය ගොඩනැගීම සහ ක්‍රියාවන් ගොඩනැගීම ආත්මයෙන් කොපමණ ප්‍රමාණයක්ද .. ? මාංශයෙන් කොපමණ ප්‍රමාණයක් ද .. ? කියා හඳුනාගත හැකි එකම තැනැත්තා දෙවියන් වහන්සේ පමණක් වන සේක. ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියේ සිටින විට බොරුවෙන් සත්‍යය සහ ක්‍රිස්තුස් වහන්සේගෙන් මාංශයේ ක්‍රියාව වෙන් කිරීම සිදු කරනු ඇත. එමෙන්ම රන්, රිදී, අනර්ඝ ගල් වලින් අනිත් මූලද්‍රව්‍යය වන ලී, තෘණ, පිදුරු සම්පූර්ණයෙන්ම වෙන්කරන සේක. එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. **"එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. එක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය."** (1 කොරින්ති 3:13) ශුද්ධවන්තයන්ගේ මෙම විනිශ්චය සිදුවන තුරු දෙවියන් වහන්සේගේ සෑම සේවකයෙකුගේම ජීවන කාර්යය පැහැදිලිව හා විවෘතව ප්‍රකාශ නොවන බව මෙම වචන වලින් පෙනෙන්නේය. අපගේ ජීවිතවල මිශ්‍ර තත්ත්වයන් පවතින නිසාත්, වර්තමාන තත්ත්වය තුළ අපගේ මනසේ ඇති දුර්වලතා නිසාත්, අපගේ ක්‍රියාවන් පිළිබඳ සියලු විස්තර මේ ජීවිතයේ අප කිසිවෙකුට තේරුම්ගත නොහැක. වර්තමානයේ කිසිදු ක්‍රියාවක් එහි පූර්ණත්වය තුළ දැකිය නොහැකිය. මේ ජීවිතය තුළ සෑම ක්‍රියාවකම අදෘශ්‍යමාන ආත්මික ගුණාත්මකභාවය සහ සදාචාරාත්මක කාරණාවල නොපෙනෙන්නා වූ ස්වභාවය අවබෝධ කර ගැනීමට නොහැකිය.

අයිස් කඳු මුහුදේ පාවෙන විට එම අයිස් කන්දෙන් සියයට අනූවක්ම (90%) වතුර යට තිබෙන බව අපි පවසන්නෙමු. ඇසට පෙනෙන්නේ අයිස් කන්දෙන් සියයට දහය (10%) ක් පමණි. මෙය අපගේ සියලු ක්‍රියාවන්, හැසිරීම් සහ වචනවල ස්වභාවය පැහැදිලි කිරීමට උපකාරී වේ. මක්නිසාද සෑම ක්‍රියාවකම යම් කොටසක් මිණුමකින් දැන ගැනීමට සහ විනිශ්චය කිරීමට අපට හැකි වුවද අපගේ ක්‍රියාවන් සහ වචන වලින් වැඩි කොටසක් ආත්මික මුහුදේ ගිලී පවතින ැවින් ඕනෑම ක්‍රියාවක හෝ ඕනෑම වචනයක විශාලත්වය සම්පූර්ණයෙන්ම මැනීමට හෝ සැකසීමට අපට පුළුවන්කමක් නැත.

එකම ක්‍රියාව විවිධ පුද්ගලයන් සියදෙනෙක් විසින් කළ හැකි වුවත් එම ක්‍රියාවට විවිධ ස්වභාවයන් සහ චරිත මට්ටම් අඩංගුවිය හැකිය. එබැවින් එම ක්‍රියාවට එක් එක් පුද්ගලයාට එකම ත්‍යාගයක් හෝ දඬුවමක් ලැබෙන්නේ නැත. මක්නිසාද එක් එක් පුද්ගලයාගේ ක්‍රියාව තුළ අපි නොදන්නාවූ ස්වභාවයන් අඩංගු වී තිබේ. ගින්නෙන් සෑම පුද්ගලයෙකුගේම ක්‍රියාවන් සෝදිසි කරන බව මෙම බයිබල් ඡේදයේ අපට පවසන්නේය.

සාමුවෙල්ගේ මව වූ හන්නා තම කුඩා දරුවා වූ සාමුවෙල්ව ස්වාමීන් වහන්සේට ඔප්පු කිරීමට ෂිලෝ වෙතට ගිය අවස්ථාවේදී පුදුමාකාර අනාවැකියක් ප්‍රකාශ කළේය. ජෙහෝවා දෙවියන් වහන්සේ සියල්ල දන්නා වූ දෙවියන් වහන්සේ බවත්, උන්වහන්සේ එකිනෙකාගේ ක්‍රියාවන් කිරා බලන

6 පිටුවට

5 පිටුවෙන්

සියළු මනුෂ්‍යයන්ගේ කර්මාන්තය ...

බවත් ඈ කීවාය. (1 සාමුවෙල් 2:3) එය ඉතා අනර්ඝ වූ ප්‍රකාශයකි. දෙවියන් වහන්සේ අපගේ ක්‍රියාවන්, අපේ වචන, අපේ සිතුවිලි කිරා බලන සේක. එමෙන්ම අපගේ සියලු ක්‍රියාවලින් සහ හැසිරීම් වලින් නිශ්චිතවම අනිත් අයට ප්‍රකාශ කිරීමට හැකිව තිබෙන වැදගත් ස්වභාවයක් කිරා බලන සේක.

"ඒ පිට ගොඩනැගුවා වූ යම් කෙනෙකුගේ කර්මාන්තය පවතී නම් ඔහු විපාකයක් ලබන්නේය. යම් කෙනෙකුගේ කර්මාන්තය දැවී යන්නේ නම් ඔහුට අලාභ වන්නේය. නුමුත් ඔහුට ගැලවෙන්නේය. එහෙත් ගිනි මැදින් ගැලවුනාක් මෙන්ය. " (1 කොරින්ති 3:14-15)

මෙම බයිබල් ඡේදයෙන් ධනාත්මකව ඔප්පු කරන්නේ සමහරුන් ඔවුන්ගේ ක්‍රියාවන් ශුද්ධ ලියවිල්ලට අනුකූල නොවන නිසා හෝ දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් ක්‍රියා කර නැති නිසා දැවී යාමට ලක්වී ඇතත් විනාශ වී සිටියා අයව මිදීම වෙතට ගෙනැවිත් ඇති බවයි.

ගැලවීම එක් දෙයක් බවත්, විපාක දෙනු ලැබීම සම්පූර්ණයෙන්ම තවත් දෙක් බවත් අපි මතක තබා ගත යුතුය. විනිශ්චාසනය ඉදිරියේ දී විශාල යෝධ ගින්නකින් මෙන් වරදි සහිත දේශනාවන්, ව්‍යාජ පොත්පත්, ආත්මාර්ථකාමී යාච්ඤාවන්, ආත්මාර්ථකාමී ලෙස මුදල් ලබාදීම් සහ ලෞකික ආගමික ක්‍රියාවන් දැවී යන්නේය. මක්නිසාද ඒවායේ ස්වභාවය ලී, තෘණ සහ පිදුරු වැනිය. බොහෝ අනර්ඝ දේශනා බොහෝ අලංකාර ගීතිකා, දක්ෂ ලෙස වචන හසුරුවන්නාවූ යාච්ඤා කිරීම්, ආත්මාර්ථකාමීත්වයේ චේතනාව මත මිලියන ගණන් මුදල් ප්‍රදානය කිරීම්, පටු මතවාදී උඩඟුකම, මාංශික ලෙස හැඩගැසුණා වූ කාර්යබහුල සේවය ආදී දේවල් සම්පූර්ණයෙන්ම දැවී විනාශවී යන්නේය. ඒවාට කිසිදු ආශිර්වාදලත් ප්‍රතිවිපාකයක් ලැබෙන්නේ නැත. මක්නිසාද ඒවාට විනිශ්චාසනය ඉදිරියේ සිටීමට හැකියාවක් නැත. ගින්නෙන් බේරෙන දේවල් හැර කිසිම ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ කාරයයන් සඳහා විපාකයක් ලබාදෙන්නේ නැත. මක්නිසාද අපෝස්තුළුවරයා මෙලෙස සඳහන් කරනු ලබන්නේය. **"ඒ පිට ගොඩනැගුවාවූ යම් කෙනෙකුගේ කර්මාන්තය පවතී නම් ඔහු විපාකයක් ලබන්නේය."** (1 කොරින්ති 3:14) විපාකය හරියටම ක්‍රියාවේ ගුණාත්මකභාවයට මෙන්ම, ක්‍රියාවේ විශාලත්වයට හෝ බරට සහ දිව්‍යමය ප්‍රේමයේ හෝ පූජාවීමේ හෝ ඇදහිල්ලේ හෝ ක්‍රියාවට නංවා ඇති උත්සාහයේ ප්‍රමාණයට අනුරූපව තිබේ. මෙම ප්‍රතිවිපාකය අපගේ ජීවිතවල කුඩාම දේවල්වල සිට විශාලම දේවල් දක්වා විහිදේ. යේසුස් වහන්සේගේ නාමය නිසා තවත් කෙනෙකුට වතුර වීදුරුවක් දුන්නත් අපට ප්‍රතිවාපකයක් ලබාදෙන බව යේසුස් වහන්සේ පැවසූ සේක. (මාර්ක් 9:41)

මේ දෙවල් සලකා බැලීමෙන් අපට හැකි පමණින් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ සත්‍යය අපගේ ජීවිතවලට උපරිම භක්තියකින් යෙදවීමට පෙළඹිය යුතුය. පරිපූර්ණ සත්‍යය සහ පරිපූර්ණ ප්‍රේමය හැර අන් කිසිවක් ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය පසුකර නොයනු ඇත. දෙවියන් වහන්සේගේ ආලෝකය සහ සත්‍යය සදාකාලයටම දරා සිටීමට එවැනි කාරණා යෝග්‍යව තිබේ.

සේවය සඳහා ආත්මයාණන් වහන්සේගේ බලය

ඩී.එල් මූඩි විසිනි.

යොහාන් සුභාරංචියේ හත්වන පරිච්ඡේදයේ ස්වාමී වූ යේසුස් වහන්සේ තුළ විශ්වාසය ඇතිව සිටීමෙන් ආත්මයාණන් වහන්සේව ලබාගත හැකි බව උන්වහන්සේ පැවසූ බව සොයාගත හැකිය. **"මා කෙරෙහි අදහන්නා තුළින් ශ්‍රියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදාය වතුර ඇති ගංගා ගලන්නේ යයි කී සේක."** (යොහාන් 7:38)

එහිදී ක්‍රියාමාර්ග දෙකක් හොඳින්ම සොයාගත හැකිය. මම ළමයෙක් කාලයේදී එංගලන්තයේ අළුත් ගොවිපළක සිටියා මට මතක තිබේ. එහි පරණ ලී පොම්පයකින් ක්‍රියාකරන නළ ළිඳක් තිබුණි. පිරිසිදුවීමට සහ කේතලයට වතුර ගැනීමට මම ඒ ළිඳේ වතුර පොම්පය පාවිච්චි කලෙමි. මම මගේ අත් වෙහෙසට පත්වනතෙක්ම බොහෝ අවස්ථාවක් එම පොම්පය ක්‍රියාත්මක කළෙමි. නමුත් දැන් ඔවුන්ට ඊට වඩා හොඳ ක්‍රමයක් තිබේ. ඔවුන් අඩි කිහිපයක් හාරා සිදුරට ගඩොල්දමා පොම්පය දමන්නේ නැත. නමුත් ඔවුන් මැටි, වැලි සහ ගල් හරහා පහළට බැස යන්නෝය. එවිට ගැඹුරේ යටින් ඇති ජලය ඉබේම ඉහළට පැමිණෙන බැවින් ශ්‍රමයක් යෙදීමට අවශ්‍ය නොවන අතර පීඩනය නිසා ඉබේම ජලය පිටතට එන ළිඳක් ඇතිවී තිබේ.

දෙවියන් වහන්සේගේ සෑම දරුවෙක්ම පොම්ප කරන්නේ නැතිව පීඩනය සහිත ළිඳක් මෙන් ඉබේම වතුර ගලා යන්නා වූ අය බවට පත්වීම දෙවියන් වහන්සේට අවශ්‍යව ඇතැයි මම සිතමි. දේශනා කූඩුවේදී පොම්ප කරමින් ...,, පොම්ප කරමින්..., පොම්ප කරමින් ...., සිටින්නා වූ දේවදාසයන්ව ඔබ දැකලා නැද්ද .. ? මම බොහෝ විට එය දැක ඇත්තෙමි. මටත් බොහෝ විට එය කරන්නට සිදුවී තිබේ. ඒක කොහොමද කියා මම දනිමි. දේවදාසයන් දේශනා කූඩුව තුළ සිට කථාකරමින්...., කථාකරමින් ....., කථාකරමින්..., සිටින අතර සෙනඟ නින්දට පත්වී සිටිති. ඔවුන්ට අවදිවීමට නුපුළුවන. ප්‍රශ්නයවී තිබෙන්නේ කුමක්ද ... ? ජීවනදායක ජලය එහි නොමැතිවීමයි. ඔවුන් පොම්ප කරන නමුත් ළිඳේ වතුර නැත. වියලුනු ළිඳකින් ඔබට වතුර පිටතට ගෙන ඒමට නොහැකිය. වියලුනු ළිඳකින් යම් දෙයක් හෝ කුමන හෝ දෙයක් ඔබට පිටතට ගෙන ඒමට නුපුළුවන. මම මේ ලී පොම්පය දැක තිබෙනවා ඔබ වතුර ටිකක් පොම්ප කිරීමට පෙර එයට වතුර වත්කළ යුතුය.

එනිසා යහපත් බොහෝ මනුෂ්‍යයන් සමඟ වුවත් එසේය. ඔබට යමක් ලබා ගැනීමට පෙර ඔබ ඒවාට යමක් ඇතුල් කළ යුතුය. ඔවුන්ට ආත්මික බලය නැත්තේ ඇයි කියා මනුෂ්‍යයන් පුදුමයට පත්ව සිටිති. ඔවුන් නැගී සිටිති. කථා කිරීමට රැස්වෙති. නමුත් කිසිවක් පැවසීමට නොහැකිය. ඔවුන් තමන්ට කිසිවක් පවසන්නට නැතැයි කියි. ඔවුන් එය ප්‍රකාශ කිරීමට අවශ්‍යය නොවන අතර ඔබට එය ඉක්මනින් සොයා ගැනීමට හැකිවේ. ඔවුන් කථා කරන්නේ එය වගකීමක් යැයි හැගෙන නිසාය. නමුත් ඔවුන් කිසිවක් නොකියති. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ සේවය සඳහා අප තුළ නතරවී සිටින විට අපි ආලේපය ලබා ඇත්තෙමු. එවිට අපට බලවත් දේ කළ හැකිය. දෙවියන් වහන්සේ මෙසේ පවසන සේක. **"වක්නිසාද පිපාසා ඇත්තා කෙරෙහි වතුර ද, වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරුවන්නමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මය ද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදය ද වගුරුවන්නෙමි."** (යෙසායා 44:3) එය කොපමණ ආශිර්වාදලත් කාරණයක්ද .. ? **"ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශිර්වාද ලද්දෝය. මක්නිසාද ඔවුහු තෘප්තියට පැවිශෙන්නෝය."** (මතෙව් 5:6)

ගංගාවක් සේ උතුරා පිටාරා ගලායන්න.

යම් කෙනෙක් ජීවමාන ජලයෙන් පිරී සිටිනවා දැකීමට මම කැමැත්තෙමි. එයින් පිරී සිටින විට ඔවුන්ට එය පැතිරීම වළක්වාගත නොහැකිය. එම නිසා ඔවුන් පිටතට ගොස් දෙවියන් වහන්සේගේ කරුණාවේ සුභාරංචිය පතල කරනු ඇත. මනුෂ්‍යයෙක් ජීවන ජලයෙන් පිරී සිටින විට එය දරා සිටීමට ඔහුට නොහැකිව ඊළඟට ඔහු දෙවියන් වහන්සේගේ සේවය සඳහා සූදානම්ව සිටන්නෝය.

දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අප තුළ රැඳී සිටින විට ලෝකයට, මාංශයට, සාතන්ට විරුද්ධව අපි ජයගනු ලබන්නෙමුව. අපගේ කේන්තිය, උඩඟුකම සහ අනෙකුත් සෑම නපුරුකමකින්ම අපට ජය ලබාදෙන යම් දෙයක් අප සතුව ඇත. මෙම පාපයන් අපගේ දෙපා යට දමා පාගා ගැනීමට හැකි වූ විට මනුෂ්‍යයන් අප වෙතට පැමිණ ඔබට එය කළ හැකි වූයේ කෙසේදැයි අසනු ඇත. මටත් ඒ බලයට අවශ්‍යයයි ඔබට තිබෙන්නා වූ යම් දෙයක් මම ලබාගෙන නැත. මට එය අවශ්‍යව තිබේ යැයි පවසන්නෝය.

දෙවියන් වහන්සේ අපට මෙම සත්‍යතාවය පෙන්වා දෙන සේක. මුළු රාත්‍රියේම අපි වෙහෙස වී වැඩ කළ යුතුද ... ? දකුණු පැත්තට දැල හෙළමින් අපගේ පාපය පිළිබඳව දෙවියන් වහන්සේගෙන් සමාව අයැද සිටීමින් ඉහළින් පැමිණෙන බලයෙන් අපව ආලේප කරන ලෙස ඉල්ලා සිටිය යුතුය. නමුත් නොඉවසිලිවන්ත හෝ ආත්මාර්ථකාමී මනුෂ්‍යයන්ට උන්වහන්සේ මේ බලය ලබා නොදෙන බව මතක තබාගන්න. එසේ නොමැති නම් ආත්මාර්ථකාමී ඉලක්ක සහිත අභිලාෂයක් ඇති අයටද එය ලබා නොදෙන සේක. මාගේම ආත්මයේ උඩඟුකමින් සහ ලෞකික සිතුවිලි වලින් හිස්වන තෙක් දෙවියන් වහන්සේ එය ලබා නොදෙන සේක. අප සොයන්නේ දෙවියන් වහන්සේගේ මහිමය මිස අපගේ මහිමය නොවිය යුතුය. අප එම තත්ත්වයට පැමිණිවිට දෙවියන් වහන්සේ අපට යහපත පිණිස කොයිතරම් ඉක්මනින් ආශිර්වාද කරනවා ඇද්ද ... ? ඊළඟට අපගේ ආශිර්වාදයේ ප්‍රමාණය උතුරා යනු ඇත.

ස්වර්ගීය මිනුම් ප්‍රමාණය කුමක්දැයි ඔබ දන්නවාද ... ? හොඳ මිනුමකින් පහළට තදකර, එකට සොළවා උතුරා යන්නට සැලැස්වීමයි. (ලූක් 6:38) අපි දෙවියන් වහන්සේගේ වචනයෙන් අපගේ හදවත් පුරවාගෙන තිබෙනවා නම් සාතන් ඒ තුළට ඇතුල්වන්නේ කෙසේද .. ? ස්වර්ගීය මිනුම යහපත් සම්පූර්ණ වූ (පිරුණාවූ) උතුරා යන්නා වූ මිම්මකි. ඔබ මෙම පූර්ණත්වය ලබා තිබෙනවාද ... ? ඔබ එය ලබා නැතිනම් එය සොයන්න. දෙවියන් වහන්සේගේ කරුණාව කරුණුකොටගෙන ඔබට එය ලැබී තිබෙන බව පවසන්න. පියාණන් වහන්සේ මේ යහපත් දේ ලබාදීමට සතුටුව සිටින සේක. (ලූක් 12:32)

උන්වහන්සේට අවශ්‍ය අපි මේ ලෝකයේ බැබලෙනවා දකින්නයි. අපි උන්වහන්සේගේ කාර්යය සඳහා නැගී සිටිනවා දැකීමට උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. අපි දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ වෙනුවෙන් සාක්ෂිකාරයන්වීමට බලය ලබා ගැනීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. උන්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට උන්වහන්සේ අපව මේ ලෝකයේ තබා ඇත. උන්වහන්සේ අපව මෙහි තබා ඇත්තේ මිලදී ගැනීමට, විකිණීමට හෝ ලාභ ලබාගැනීමට නොව, ක්‍රිස්තුස් වහන්සේට මහිමයට පත්කිරීමටය. ආත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය නැතිව ඔබ එය කරන්නට යන්නේ කෙසේද ... ? ප්‍රශ්නය වී තිබෙන්නේ එයයි. දෙවියන් වහන්සේගේ බලය නැතිව එය කරන්නේ කෙසේද .. ?

ක්‍රිස්තුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **"නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැවිණී කළ නුඹලා බලය ලබන්නාහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද, සමාරියෙහිද, පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුයයි කී සේක."** (ක්‍රියා 1:8) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මහිමයට පැමිණීමෙන් දවස් දහයකට පසුව ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය ලබාදීම තුළ පෙන්තකොස්ත දවස පැමිණියේය. සමහර විට දෙවියන් වහන්සේගේ බලය දැන් තිබීමේ හැකියාව ගැන සමහරු ප්‍රශ්න කරති.

නැවුම් සැපයීම

ක්‍රියා 4:31 වන පදය වෙතට හැරෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවෙනි වරට පැමිණි විට ඔවුන් රැස්ව සිටි ස්ථානය කම්පා විය. ඔවුන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පිරුණෝය. කාරණය නම් අපි පිටාරා ගලා යන භාජන සහ ක්‍රිස්තුස් වහන්සේගෙන් පිරී සිටින භාජනවීමට සෑමවිටම දිය උල්පත යටතේ අපි අපගේ ජීවිත තබාගත යුතුය. ඒ අතරම නැවුම් සැපයීමක් තිබිය යුතුය. අප අතරේ බොහෝ දෙනෙක් කරන්නා වූ වැරැද්දක් නම් අවුරුදු දහයකට

7 පිටුවට

6 පිටුවෙන්

සේවය සඳහා ආත්මයාණන්...

දෙවියන් වහන්සේගේ කාර්යයේ යෙදීමට උත්සාහ දැරීමයි. එය අවශ්‍යව තිබේ නම්, එම කරුණාව සමඟම අපි ගමන් කරන බව අපි පවසන්නෙමු. අපට අවශ්‍ය වන්නේ නැවුම් සැපයීමක්, නැවුම් ආලේපයක්, නැවුම් බලයක් වන්නේය. අපගේ මුළු හදවතින් එය සොයනවා නම් අපි එය හිමිකර ගන්නෙමු.

පළමු සභාවේ දී ගැලවීම වෙතට හැරුණා වූ අය මෙම බලය උදෙසා බලා සිටීම ඉගෙන ගත්තෝය. පිලිප් සමාරියට ගියේය. සමාරිය තුළ මහත් කාරණා සිදුවෙන බව යෙසරුසලමට ආරංචි විය. එමෙන්ම බොහෝ දෙනා ගැලවීම වෙතට පැමිණියෝය. ප්‍රේත්‍රුස් සහ යොහාන් ගොස් ගැලවීම වෙතට හැරුණා වූ අය මත ඔවුන්ගේ අත් තැබුවෝය. එවිට සමාරියේ සිටි ගැලවීම ලැබුවාවූ අය මතට සේවය සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි සේක. කිතුණුවන් ලෙස දෙවියන් වහන්සේගේ සේවය සඳහා අපි උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේව බලා සිටිය යුතු වන්නේ එබැවිනි. දෙවියන් වහන්සේට අපව උන්වහන්සේගේ සභාව ගොඩනැගීම සඳහා සහ උන්වහන්සේගේ මහිමය ඉක්මනින් ප්‍රකාශ කිරීම සඳහා බලවත් ලෙස පාවිච්චි කිරීමට හැකිවන්නේය. ක්‍රියා 19 වන පරිච්ඡේදය අපි කියවන විට එපීසයේ මනුෂ්‍යයන්ගෙන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ භෞතිස්මය ගැන අසද්දී ඔවුන් ගැලවීම ලැබූ කාලයේ **පටන් ශුද්ධාත්මයාණන් වහන්සේ ඇති බවවත් අසා තිබුණේ නැත. ඒ මනුෂ්‍යයන්ගේ ගණන දොළසකි. "සවහර ගෝලයන් සවිබන්ධව නුඹලා අදහාගත් කළ ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබුවහුදැයි ඔවුන්ගෙන් ඇසුවේය. ඔවුහු නැත. ශුද්ධාත්මයාණන් වහන්සේ ඇති බවවත් නොඇසීවු යයි කීවෝය."** (ක්‍රියා 19:2) මම නිර්භීතව පවසනවා ඔබ විශ්වාස කිරීමට පැමිණිදා සිට ඔබ ශුද්ධාත්මයාණන් වහන්සේ ලබාගෙන තිබෙනවාදැයි කියා ඇසූ විට මම දන්නේ නැහැ. ඔබ එයින් අදහස් කරන්නේ කුමක්ද කියා බොහෝ දෙනාගේ පිළිතුර වන්නේය. ඔවුන් එපීසයේ මනුෂ්‍යයන් දොළොස් දෙනා මෙන් දෙවියන් වහන්සේගේ පුත්‍රයන්ට බෙදා දෙන ආත්මයාණන් වහන්සේගේ සම්බන්ධතාවය කිසිදාක අවබෝධ කරගෙන නැත.

සභාව මෙම අවබෝධය නිශ්චිතවම අත්හැර දමා තිබෙන බව මම විශ්වාස කරමි. යම් තැනක එය සොයාගත නොහැකි නම් කිතුණුවන් බල රහිත වේ. සමහර අවස්ථාවලදී ඔබට සිය දෙනෙක් වුවත් සභාවට ගෙන ඒමට පුළුවන. ඔවුන් එහි බලයට එකතු නොවේ. ඒ සියල්ල වැරදිය. ඔවුන් දෙවියන් වහන්සේගේ ආලේපය ලබාගෙන ගැලවුණා වූ සියදෙනෙක් සභාවට එකතු කරන්නේ නම් එහි ඉතා විශාල බලයක් පවතින්නේය.

පිපාසය ඇති අය වෙත ජලය ගලා යන්නේය.

වර්තමානයේ සභාව තුළ විශාල සංඛ්‍යාවක් කාන්තාරය මෙන් වියලී සිටිති. සෑම දෙයම දේශනා කරනු ලැබූවත් ගරාවැටුණු සහ ඔවුන් තුළ ජීවය නැති බව පැහැදිලිව පෙනෙන්නේය. ඔවුන් දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පිරුණා වූ කොළපාට කොළ ඇති ගසක් මෙන් ඵලදරන්නා වූ මනුෂ්‍යයෙක් ළඟින් වාඩිවී සිටියත් ඔවුන් ඒ ආකාරයෙන් ආශිර්වාදයක් සොයන්නේ නැත. මෙසේ වෙනස්ව තිබෙන්නේ ඇයි ... ? දෙවියන් වහන්සේ ජීවන ජලය වගුරුවන්නේ පිපාසා ඇති අය කෙරෙහි නිසාය. වෙනස්වීමට හේතුව එයයි. යම් කෙනෙක් මෙම ආලේපය සොයමින් සිටිද්දී ඔහුට එය හිමිවේ. අපි අනිත් සියල්ලට ඉහළින් අපට මේ ආලේපය අවශ්‍යව තිබෙන විට දෙවියන් වහන්සේ අපට එය ලබාදෙන සේක. දැන් අප ඉදිරියේ තිබෙන විශාලම ප්‍රශ්නය වන්නේ අපට එය අවශ්‍ය කරනවාද යන්නයි.

මම ප්‍රථම වතාවට එංගලන්තයට ගොස් එහිදී බයිබලය කියවීමක් ලබා දුන් විට, මම ඒ රටේදී දුන්නා වූ එම පළමු කියවීමේදී බොහෝ විශාල සේවයන් කළ දේවදාසයන් එහි සිටියෝය. ඉංග්‍රීසි අයගේ දේවධර්මය පිළිබඳව මම කිසිවක් දැන සිටියේ නැත. මම ඔවුන්ගේ ඇදහිල්ලට (ජීවන රටාවේ විශ්වාසයන්ට) විරුද්ධව ගමන් කරයි කියා මම බිය වූයෙමි. විශේෂයෙන්ම සේවය සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව නැමති මෙම විෂය පිළිබඳව මම ටිකක් බාධාවකට පත්වූයෙමි. එහි එක් දේව සේවකයෙක් ඔහුගේ දෑත් හිස මත තබාගෙන හිස නමාගෙන සිටියේය. මා පවසන්නාවූදේ සමඟ තමාගේ කාරණා ගැන ලැජ්ජා සහිත තත්ත්වයට පත්ව සිටන යහපත් මනුෂ්‍යයෙක් යැයි මම සිතුවෙමි. ඇත්තටම ඔහුගේ ක්‍රියාව මට කරදරකාරී තත්ත්වයක් විය. මම සෙනඟ අමතා අවසන් වූ විට ඒ පුද්ගලයා තමාගේ තොප්පියක් අතින් රැගෙන පිටත්ව ගියේය. නැවත ඔහුව දකින්නට නොලැබේවි. එය හොඳ යැයි මම සිතුවෙමි. ඊළඟ රැස්වීමේදී මම ඔහුව සෙවූ නමුත් ඔහු එහි සිටියේ නැත. ඉන්පසුව තිබූ රැස්වීමේදී මම ඔහුව සෙවූ නමුත් එහිත් ඔහු සිටියේ නැත. මගේ ඉගැන්වීමෙන් ඔහුගේ සිත රිදෙන්නට ඇතැයි මම සිතුවෙමි.

නමුත් දින කිහිපයකට පසුව දහවල් කාලයේ පැවැත්වූ විශාල යාච්ඤා රැස්වීමකදී එක් මනුෂ්‍යයෙක් නැගී සිටි අතර ඔහුගේ මුහුණ කඳු මුදුණේ දී දෙවියන් වහන්සේව මුණ ගැසුණා වූ කෙනෙක් මෙන් දිදුළමින් තිබුණේය. මම ඔහු දෙස බලා මම කලින් සෙවූ සහෝදරයා ඔහු බව දැක මහත් ප්‍රීතියට පත්වූයෙමි. ඔහු නැගී සිට මෙලෙස කීවේය. දේවදාසයා බයිබලය කියවද්දී සුභාරංචිය දේශනා කිරීමට අවශ්‍ය නැවුම් බලය පිළිබඳව කථා කරනවා මම ඇසූවෙමි. එය තමා වෙනුවෙන් නම් තමන්ට එය ලැබෙනු ඇති බව තම සිතේ තබාගත්තා යැයි ඔහු පැවසුවේය. මේ මනුෂ්‍යයා කලින් දේව වචනය ඇසූ දවසේ තමාගේ නිවසට ගොස් ස්වාමීන් වහන්සේව සොයමින් පොර බැඳුවේය. වෙන කවදාවත් ඔහු එලෙස පොරබදා තිබුණේ නැත. ඔහු තමන් නොදන්නා වූ තමාගේ හදවතේ පව්කාර බව පෙන්වා දෙන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටි අතර ඔහු හිස්වී දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පිරී යන ලෙස දෙවියන් වහන්සේට බලවත් ලෙස මොරගැසුවේය. මගේ යාච්ඤාවට දෙවියන් වහන්සේ පිළිතුරු දුන්නා යැයි ඔහු කීවේය.

ඒ දවසේ සිට මාස හයකට පසුව මට ඔහුව නැවත එඩින්බර්ග් හිදී මුණගැසුණේය. එදා සිට මේ වන තුරු සැමදාම රාත්‍රියේ ඔහු සුභාරංචිය දේශනා කරන බව ඔහු කීවේය. මම එකම දේශනාවක් දේශනා නොකළෙමි. සමහර අය සමඟ සංවාදයේ යෙදුනෙමි. විවිධ වූ සභාවන් වල සෑම රාත්‍රියකම සුභාරංචිය දේශනා කරන පිණිස ගිවිසුමකට බැඳුනෙමි. කියා ඔහු කීවේය. මම සිත්නේ ඔහුගේ දේවස්ථානය හරහා කාලතුවක්කු ප්‍රහාරයක් ගමන් කලාක් මෙන් කිසිවෙකු පෙර අත්දුටු මෙම ආලේපය ඔහු කරුණුකොටගෙන හිමිකර ගැනීමට පැමිණියේය. දේවස්ථානය පිරීගොස් ජනාකීර්ණවීමට දින තිහක් ගත නොවීය. ඔහුගේ ජීවිතය ජීවන ජලයෙන් පිරී තිබුණු අතර එය දැනගත් මනුෂ්‍යයන් සෑම තැනකින්ම ඔහු වෙතට රොක් වූවෝය. ඔබට දිය උල්පතට ඉහළින් ජලය ලබාගත නොහැකිය. අපට විශේෂයෙන්ම අවශ්‍යව තිබෙන්නේ දෙවියන් වහන්සේගේ බලයයි.

එහි තවත් වයසක දේවදාසයෙක් ගැන මගේ මතකයේ තිබේ. ඔහු මෙසේ කීවේය. මම හදවත් රෝගී තත්ත්වයෙන් පෙළුනෙමි. සතියකට එක් වරකට වඩා දේශනා කරන්ට මට නොහැකි විය. එම නිසා මම මා වෙනුවෙන් දේශනා කිරීමට සහ බැහැදැකීමේ සේවය සඳහා සහකරුවෙකු තබා ගත්තෙමි. මෙම ආලේපය ගැන ඇසූ විට මැරී සිටියා වූ මට ජීවනය ලැබුණාක් මෙන් දැණුනි. එතැන් පටන් කලින් මෙන් සුභාරංචිය දේශනා කිරීමට වරප්‍රසාදය සමඟ බලය ලැබුණි. කියා කීවේය. දෙවියන් වහන්සේගේ ආත්මයෙන් ඔහුව පුරවන ලෙස ඔහු යාච්ඤා කළේය. වැඩිකල් නොගොස් ඔහුව නැවත මට මුණ ගැසුණි. එවිට ඔහු මෙලෙස කීවේය. දැන් දළ වශයෙන් මම සතියකට දේශනා අටක්වත් කරනවා. ඒ වගේම සතිය පුරාම සංවාද කරමින් සුභාරංචිය ප්‍රකාශ කරනවා යැයි කීවේය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ඔහු කෙරෙහි පැමිණ තිබුණේය. ඒ මනුෂ්‍යයා සේවයේ තිබුණා වූ වෙහෙසකර බව නිසා බිඳ වැටුණා යැයි මම විශ්වාස නොකරමි. යන්ත්‍ර සූත්‍රවලට තෙල් නැතිව පාවිච්චි කිරීමට උත්සාහ දැරීම මෙන් බලය නැතිව සේවය කිරමට උත්සාහ දැරීමෙන් රෝගී තත්ත්වයට හසුව බිඳ වැටී තිබුණි.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව ආලේප කරන සේක. සේවය පමණක් නොව සෑම ගෝලයෙක්වද ආලේප කරන සේක. එය අවශ්‍ය එකම මෙහෙකරුවන් දේවගැතිවරුන් පමණක් යැයි නොසිතන්න. මව්වරුන්ටත්, ඇගේ නිවසේ පාලනය උදෙසාත් මෙම ආලේපය අවශ්‍යය. දේශනා කුඩුවේ දේශනා කිරීම සඳහා හෝ සබත් පාසල් ගුරුවරයාට සබත් පාසල උදෙසාත් එය අවශ්‍ය වේ. අප සියලුදෙනාට දෙවියන් වහන්සේගේ ආලේපය අවශ්‍යව තිබේ. එය හිමිකරගන්නා තෙක් දහවල් හෝ රාත්‍රියේ දී විවේක ගැනීමට අපට නුපුළුවන. සියල්ලට වඩා ඉහළින් තිබෙන අවශ්‍යතාවය ලෙස එය අපගේ හදවත් තුළ පවතිනවා නම් ඒ උදෙසා පිපාසයෙන් සහ උවමනාවෙන් සිටිනවා නම්, දෙවියන් වහන්සේගෙන් එම නැවුම් ආලේපය ලබන පිණිස මෙලෙස යාච්ඤා කරන්න. "දෙවියන් වහන්ස, මට උපකාර කළ මැනව. ඉහලින් පැමිණෙන්නාවූ එම බලය ලැබෙන තෙක් මම විවේක නොගන්නෙමි." දෙවියන් වහන්සේ ඔබගේ යාච්ඤාවට පිළිතුරු ලබාදී ඔබව උන්වහන්සේගේ ආලේපයෙන් පූර්ණ කරන සේක්වා .... !

ඔබ යාච්ඤා කරන යාච්ඤා වලට පිළිතුර වීමට ඔබ සූදානම්ද ? ....

කිම් බට්ස් විසිනි.

අවශ්‍යතා ඇති යම් කෙනෙක් හෝ පවුලක් අපි දුටුවිට හෝ එවැනි දෙයක් ඇසූ විට එම වාතාවරණය තුළ ස්වාමීන් වහන්සේ එම පුද්ගලයාට උපකාර කළ මැනව, එම පුද්ගලයාව මුණගැසීමට යම් කෙනෙක්ව එවූව මැනව කියා යාච්ඤා කිරීමට අපි සිතන්නෙමු. අපි සියලුදෙනාටම එසේ විය හැකිය. ඔබගේ යාච්ඤාවට පිළිතුරු ලබාදීමට ඔබව සහ ඔබගේ පවුලේ අයට යොදා ගැනීමට දෙවියන් වහන්සේට අවශ්‍ය නම් කුමක් කළ යුතුද ? දෙවියන් වහන්සේ මගපෙන්වන සේක් නම්, යාච්ඤා කිරීම සමඟ ඔබගේ ක්‍රියාවන් පිළියෙල කර ගැනීමට ඔබ සූදානම් ද ... ? අපේ පියාණන් වහන්සේට උන්වහන්සේ පුත්‍රයාණන්ගේ දෑත් සහ දෙපා ලෙස වේදනාවට පත්ව සිටින සහ නැතිවී සිටින මනුෂ්‍යයන් වෙනුවෙන් අපව පාවිච්චි කිරීමට අවශ්‍යව තිබෙන බව මම විශ්වාස කරමි. යේසුස් වහන්සේ අප තුළ ජීවත්වන බැවින් මෙම අවශ්‍යතාවය සපුරාලීමට හෝ මෙම පුද්ගලයාට උපකාර කිරීමට උන්වහන්සේ කුමක් කරන සේක්ද කියා අපි යාච්ඤා කරන විට සැළකිලිමත් විය යුතුය. සියලු වාතාවරණයන් මැද උන්වහන්සේ ජීවමනාව සිටින සේක. මක්නිසාද උන්වහන්සේ අප තුළ මාංශවත්ව සිටින සේක. මෙම සිතුවිල්ල සහ අවබෝධ කරන ගැනීම නිසා අපගේ යාච්ඤාවලට ප්‍රතිචාරය දක්වන ආකාරය වෙනස් කළ හැකිද ... ? යාච්ඤා කිරීම කරුණුකොටගෙන ඔබ නිවැරදි දේ කර ඇති බව සිතනවා වෙනුවට, ඔබගේ දවසේ ඊළඟ ක්‍රියාකරකම් වෙතට ගමන් කරනවා වෙනුවට ඔබගේ හදවතට ආත්මයාණන් වහන්සේ කථාකරන්නේ කුමක්දැයි ඇහුම්කන්දම කරුණු කොටගෙන ඔබගේ යාච්ඤාව ඊළඟ මට්ටමට ගෙන ඒම අවශ්‍යව තිබෙනවා නොවේද? කොපමණ අවස්ථාවන් අපි මගහැරගෙන තිබෙනවාද ? මක්නිසාද අපගේ ජීවිත හෝ වාතාවරණයන් මධ්‍යයේ යේසුස් වහන්සේට ප්‍රකාශ කරන ලෙස ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීමට ප්‍රතිචාරය වශයෙන් අප ක්‍රියාකර නොමැති නිසාය.

වඩා හොඳින් අපි ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬට ඇහුම්කන් දෙනවා නම් අපගේ යාච්ඤාවලට ඉක්මනින් සහ පුදුම වූ පිළිතුරු ලබාගත හැකි යැයි මම විශ්වාස කරමි. අපගේ මනස වෙනස් කර ගැනීමට ඉගෙන ගනමින් යාච්ඤා කිරීමට අපට පුළුවන් නම්, පරිවර්තනය ඇතිකරන්නා වූ උන්වහන්සේගේ නියෝජිතයන් ලෙස අපව බලවත් ආකාරයෙන් පාවිච්චි කිරීමට උන්වහන්සේට පුළුවන් බව මම විශ්වාස කරමි. ඔබ

8 පිටුවට

Reg. No: DOP/NEWS/21/2023
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

ඔබ යාච්ඤා කරන යාච්ඤා වලට ...

කරන්නා වූ යාච්ඤාවලට පිළිතුරු ලබාදීමට උන්වහන්සේ ඔබවම යෙදාගන්නේ කෙසේදැයි දැකීමට ඔබගේ පවුලේ අය ස්වාමීන් වහන්සේ දෙස නොකඩවාම බලා සිටයොත් ඔබගේ ජීවිතය කොයිතරම් තෘප්තිමත් සහ උද්යෝගකයකින් පිරී යනු ඇත්දැයි ඔබට සිතාගත හැකිද ... ?

ඉතා විශේෂ වූ නත්තලක්

මගේ යාච්ඤා ජීවිතයේ ඉතා පුදුම ලෙස එය සැබෑ වූ ප්‍රථම අවස්ථාව උදාහරණයක් ලෙස ඔබට පැවසීමට මට ඉඩදෙන්න. මම කිතුණුවෙක් වූ අලුත ස්වාමීන් වහන්සේ සියලුදේම අරුම පුදුම සහ මවිත වූ ආකාරයෙන් සිදු කළ සේක. වාසනාවකට වසර ගණනාවක් තිස්සේ එය වෙනස්වී නැත. කාන්තාවන්ගේ කුඩා කණ්ඩායමක් එක්ව දේව වචනය අධ්‍යයන කරමින් යාච්ඤා කිරීමට ඉගෙන ගන්නවා මගේ මතකයේ තිබේ. කුඩා පිරිමි දරුවන් තිදෙනෙක් සිටි එක් තරුණ කාන්තාවක් එහි සිටි අතර ඇගේ ස්වාමි පුරුෂයා වෙනත් ප්‍රාන්තයක රැකියාවේ යෙදී සිටිමින් ඔවුන්ට උපාකර කළේය. ඔහු මාස කිහිපයකට වරක් නිවසට පැමිණියේය. ඔහුට ලැබුණු ආදායම ඉතා කුඩා එකක් වූ නමුත් මේ කාන්තාව සෑම විටම ඉතා ප්‍රීතියෙන් පූර්ණව සිටියාය. අපි ඇයව මුණගැසීමට ඇගේ නිවසට ගිය අවස්ථාවකදී දරුවන්ව රැකබලා ගැනීමට ප්‍රමාණවත් මුදල් සහ අනෙකුත් දේ නොතිබුණු බව දුටුවෙමු. ඇය එම සන්ධ්‍යාවේදී යාච්ඤා කරමින් ඇගේ සැමියාව නත්තලට නිවසට එවන ලෙසත් ඔවුන්ට පවුලක් හැටියට අනර්ඝ ලෙස නත්තල සැමරීමටත් පුළුවන්කම ලබා දෙන ලෙස යාච්ඤා කළාය. මෙම කාන්තාවගේ ස්වාමිපුරුෂයාට නිවසට පැමිණීමට සහ පවුලක් ලෙස ප්‍රීතිමත් නත්තලක් ගත කිරීමට අවස්ථාව සපයාදෙන මෙන් අපිත් යාච්ඤා කළෙමු.

අපි යාච්ඤා කරන විට මේ පවුල උදෙසා යම් දෙයක් කළ යුතු බව තදින්ම හැඟී ගියෙමු. මම මගේ සිතුවිල්ල අනිත් මිතුරිය වූ නැන්සි සමඟද බෙදා ගත්තේය. මෙම වාතාවරණය වෙනුවෙන් උපකාර කිරීමට අපි තීරණය කළෙමු. ඒ උදෙසා යම් දෙවල් සැලසුම් කිරීමට අපි පටන් ගත්තෙමු. අප කළ යුතු පළමු දෙය නම් අපේ මිතුරියට මුදල් ටිකක් තැබීමයි. එබැවින් අපි ඇගේ මෝටර් රථයේ අසුනමත නිර්ණාමික ලියුම් කවරයක් තැබූවෙමි. මේ තෑග්ග තැබුවේ කවුදැයි ඇයට හෙළි නොකිරීමට අපිට තදින්ම හැඟී ගොස් තිබුණි.

ඊළඟ කුඩා කණ්ඩායම් රැස්වීමේදී ඇයගේ නිවසට ඒ සතිය සඳහා අවශ්‍යව තිබුණු ආහාරපාන ලබා ගැනීමට ප්‍රමාණවත් ලෙස මුදල් නොතිබුණු නිසා වේදනාවෙන් සිටි බව කඳුළු පිරුණා වූ දෙනෙත් ඇතිව කීවාය. ඇගේ වාහනයේ ආසනය මත තිබී ලැබුණා වූ මුදල් සහිත ලියුම් කවරය හමු වූ විට ඇය පුදුමයටත්, ප්‍රීතියටත් පත් වූ බව ඇය කීවාය. (නමුත් දෙවියන් වහන්සේ සියල්ල දන්නා සේක.) ඇයට අවශ්‍යව තිබුණු මුදල සම්පූර්ණයෙන්ම ලැබී තිබුණි. ඇය මෙසේ ප්‍රකාශ කළාය. දෙවියන් වහන්සේ මට අවශ්‍ය මොනවාදැයි මුළුමනින්ම දැන සිටි අතර උන්වහන්සේ මට එය සපයා දුන් සේක. දෙවියන් වහන්සේ ඇය උදෙසා යාච්ඤා කිරීම තුළ වගකීමක් දැරීමට පමණක් නොව, නමුත් ඇයට අවශ්‍යව තිබූ දේවල් මුළුමනින්ම ලබා ගැනීම උදෙසා ඒවා පිළියල කිරීමටත්, වගකීමක් දැරීමට අපව පාවිච්චි කිරීම ගැන නැන්සිත්, මමත් පුදුමයට පත්ව සිටියෙමු. අපි යාච්ඤා කරමින් සිටි දේ පිළිබඳව යම් දෙයක් ඉටු කිරීමට අපව නැඹුරු කිරීමට ස්වාමීන් වහන්සේට පුළුවන් බව අපි අවබෝධ කර ගතිමු.

මෙම සිදුවීම එතැනින් නතර වූයේ නැත. අපේ යහළුවාගේ මහත්තයාට නත්තලට ගෙදර එන්න බැරි උනොත් එයාව බලන්න අපේ යහළුවාට යන්න ඕනේ කියලා දැනගත්තම අපි දෙන්නා මාරුවෙන් මාරුවට එයාගේ ගෙදර නතරවී පුතාලා තුන්දෙනාව බලාගන්නට ඉක්මනින්ම ඉදිරිපත් වුනෙමු. ඇය පිටත්ව ගිය අතර අපි ඔවුන්ට නත්තල් ගහක් ගෙනැවිත්දී ඔවුන්ගේ නිවසේ එය පිළියෙල කිරීමට උත්සාහ කළෙමු. නමුත් ඔවුන්ගේ නිවසේ නත්තල් ගහේ සැරසිරිලිවලට අවශ්‍ය කිසිවක් තිබුණේ නැති බව අපි දුටුවෙමු. මමත්, මගේ යහළුවාත්, දරුවන් තිදෙනාත් එකතුවී කඩදාසි, ගම් සහ අනෙකුත් දේ රැගෙන ඇවිත් නත්තල් ගහ සැරසුවෙමු. හිම වැටෙන ආකාරයට මුළු නිවසම සැරසුවෙමු. ගෙදරදී සාදාගත් දේවලින් නත්තල් ගහද සැරසුවෙමු. කුඩා පිරිමි දරුවන් තිදෙනා ඉතා අනර්ඝ කාලයක් ගත කළ අතර නත්තල් ගහ පෙන්වීමට ඔවුන්ගේ මව නිවසට පැමිණෙන තුරු ඔවුන් නොඉවසිල්ලෙන් බලා සිටියෝය. ඔවුන්ගේ පියාටත් නිවසට පැමිණීමට හැකියාව ලබාදෙන ලෙස අපි ඒ දරුවන් සමඟ එක්ව යාච්ඤා කළෙමු. ඔවුන්ගේ මවත්, පියාත්, දෙදෙනාම දොරළඟට පැමිණ සිටගත් විට දරුවන්ගේ මුහුණුවල තිබුණු පුදුම සහගත ප්‍රීතිය කොපමණදැයි සිතන්න. ඉතා අනර්ඝ ලෙස මේ පවුල් නැවත එකට එකතු විය. එමෙන්ම ඔවුන්ට එය විශේෂ වූ නත්තලක් විය. මගේ හදවත ප්‍රීතියෙන් පිරී ගියේය. ඒ වගේම මනුෂ්‍යයන්ට උපකාර කිරීමට ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම සහ උන්වහන්සේගේ හඬ අසන්නේ කෙසේද කියා නිවැරදි ලෙස සොයා ගත්තෙමු. කීකරුවීමේ සෑම ක්‍රියාවක්ම සම්පූර්ණයෙන්ම මගේ ජීවිතය පරිවර්තනය කර තිබුණේය.

යාච්ඤා කිරීම තුලින් දෙවියන් වහන්සේ ක්‍රියා කරන සේක

මෙය ඉතා සරල උදාහරණයකි. අපි මනුෂ්‍යයන්ට උපකාර කිරීමට, යාච්ඤා කිරීමට, අවශ්‍ය නැතැයි ඔබ පැවසිය හැකිය. එය සැබෑ නමුත් අපි නිතර කඩිමුඩියේ සිටින අතර ස්වාමීන් වහන්සේ අපගේ මාවතේ තබා තිබෙන අවස්ථා අපට මඟහැරීමට පුළුවන. පවුලක් ලෙස සැමදාම කළ හැකි කෙටි යාච්ඤාවක් මම මෙලෙස යෝජනා කරන්නෙමි. "ස්වාමීන් වහන්ස ....., අපි උපකාර කළ යුතු හෝ ධෛර්යමත් කළ යුතු මනුෂ්‍යයන්ව අපට පෙන්වුව මැනව. වේදනාවෙන් සිටින හෝ අවශ්‍යතාවයන් ඇතිව සිටින අය වෙතට අපව යොමු කරමින් ඔබවහන්සේ උදෙසා ඒ පිළිබඳව යමක් කිරීමට අපට මඟපෙන්වන බව අපි විශ්වාස කරන්නෙමු. " අපගේ ප්‍රේමණීය පියාණන් වහන්සේ, ඔබ ඇහුම්කන් දෙමින් කීකරුව සිටින්නේ නම් ඔබට පිළිතුරු ලබාදෙන බව මට සහතික ලෙසම කිව හැකිය. ප්‍රථමයෙන් කුඩා දේවල් සමඟ දෙවියන් වහන්සේ ඔබට විශ්වාස කරන අතර ඊළඟට උන්වහන්සේගේ විශාල වූ සැලසුම් සහ අරමුණු සමඟ කීකරුවීම විහිදියාමට සලස්වන සේක.

අනිත් අයගේ යාච්ඤාවලට පිළිතුරක්වීමට දෙවියන් වහන්සේ විසින් අපව භාවිතා කළ හැකිවීම තවත් එක් ක්‍රියා මාර්ගයකි. අපගේම යාච්ඤාවලට අපටම පිළිතුරක්වීමට ලැබීම පුදුම සහගත වරප්‍රසාදයකි. එහිදී ඔබ දන්වා වූ අයගේ ජීවිතවල ඇති වාතාවරණයන් හෝ නැතහොත් සමහර විට ඔබ කිසිදාක මුණ නොගැසුණු අයගේ ජීවිතවල ක්‍රියා කිරීමට ඔබගේ යාච්ඤාව පාවිච්චි කිරීමට උන්වහන්සේ තෝරාගනු ලබන සේක. යාච්ඤා කිරීම මහත් වූ අභිරහසකි. නමුත් දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ නියෝජිතයන්ගේ යාච්ඤාවලට පිළිතුරු ලබාදීමට අපව පාවිච්චි කරන සේක. මෙය දැන සිටීමෙන් යාච්ඤාව ගෞරවණීය බවට පත්කරනු ලබයි. එයට අපට වැඩියෙන් යාච්ඤා කිරීමට සහ වඩා හොඳින් ඇහුම්කන්දීමට ධෛර්ය්‍ය ලබාදෙවයි. ස්වාමීන් වහන්සේ අපගේ හදවත්වල බරක් හෝ අවශ්‍යතාවයක් තබන සෑම විටම කඩුල්ලේ සිටගැනීමට අපි සූදානම්ව සිටිය යුතුය. යේසුස් වහන්සේ සැම විටම එකම ආකාරයේ වාතාවරණයන් වලදී ඔබට පාවිච්චි නොකිරීමට පුළුවන. මක්නිසාද ඔබගේ යාච්ඤාවන් නිසා උන්වහන්සේ එයට ප්‍රතිචාරය දැක්වීමට වෙනත් අයගේ හදවත් ස්පර්ශ කිරීමට පුළුවන. ඔබ දුරින් සිටින්නා වූ යම් කෙනෙක් වෙනුවෙන් යාච්ඤා කරමින්, ස්වාමීන් වහන්ස ..., ඔවුන්ට ආශිර්වාද කිරීමට හැකි වන පිණිස අද දවසේ ඔවුන්ගේ කාරණය උදෙසා ඔබගේ කැමැත්ත කරන්නා වූ දේවකයෙකුව ඔවුන් ඉදිරියේ තැබීමට හැකි වන සේක්ද කියා යහපත් ලෙස යාච්ඤා කරන විට එසේ කළ හැකිද ..? දෙවියන් වහන්සේගේ පවුලට අයිති අය ලෝකය පුරාම පැතිරී සිටින සේක. උන්වහන්සේගේ හඬට ඇහුම්කන්දීමට කැමැත්තෙන් සිටින්නා වූ හදවත් උන්වහන්සේ පාවිච්චි කරන සේක.

ශුද්ධ ලියවිල්ලෙන් උදාහරණයක්

යාච්ඤා කිරීම තුලින් ස්වාමීන් වහන්සේට යම් කෙනෙක්ව ඉතා සමීපව සම්බන්ධ කිරීම පිළිබඳව නෙහෙමියා හොඳ උදාහරණයකි. එමෙන්ම ඔහුගේ යාච්ඤා කිරීමට ඔහු දෙවියන් වහන්සේගෙන් පිළිතුරු ලබාගත්තේය. ඔහු පිළිබඳව මෙම සම්පූර්ණ විස්තරය නෙහෙමියා පොතෙන් ඔබට කියවීමට පුළුවන. ඔහු වටා සිදුවන කාරනා පිළිබඳව අවධානය යොමු කළ අතර දෙවියන් වහන්සේගේ හදවතේ ඇති දේ ගැන යාච්ඤා කරන්නේ කෙසේදැයි දැන සිටියේය. ඔහු නිහතමානීව සිටි අතර ඊශ්‍රායෙල් ජාතිය වෙනුවෙන් ඔහුට කරන්නට දී ඇති කාර්යයයේ ගෞරවය සැමවිටම දෙවියන් වහන්සේට ලබා දුන්නේය. දෙවියන් වහන්සේ ඉටු කිරීමට කැඳවූ කාරණය සඳහා නෙහෙමියා කීකරු විය. නෙහෙමියා පොතේ දෙවරක් ස්වාමීන් වහන්සේ ඔහුගේ හදවතේ තැබූ දේ ගැන මෙලෙස සඳහන් කරයි. **"තවද මම මනුෂ්‍යයන් ස්වල්ප දෙනෙකු සමඟ රාත්‍රියේ නැගිට යොදැසලුව උදෙසා කරන්ට මගේ දෙවියන් වහන්සේ මගේ සිතෙහි තැබූ කල්පනාවා කිසිම මනුෂ්‍යයෙකුට නොදන්වා ....** (නෙහෙමියා 2:12) **"පෙළපත් වශයෙන් ගණන් කරන පිණිස උත්තමයන්ද, වුලාදැණියන්ද, සෙනඟ ද රැස් කරන්නට මාගේ දෙවියන් වහන්සේ මාගේ සිත පෙළඹවූ සේක."** (නෙහෙමියා 7:5)

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

"එවි, දෙවියන් වහන්සේගේ ක්‍රියා බලවි, මනුෂ්‍ය පුත්‍රයන් කෙරෙහි උන්වහන්සේගේ ක්‍රියා කිරීම භයංකරය." (ගීතාවලිය 66:5)